# තේ ශක්ති අරමුදල

"ඉර සේවය මෙන් සැමදා සේවයට"

# වාර්ෂික වාර්තාව - 2009



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. හැඳින්වීම | 1 - 2 |
| 2. දර්ශනය, මෙහෙවර, අරමුණු | 3 |
| 3. මූල්‍ය ප්‍රගතිය | 4 |
| 4. සංස්ථාපිත තොරතුරු | 5 |
| 5. සභාපතිතුමාගේ පණිවිඩය | 6 - 8 |
| 6. තේ ශක්ති ව්‍යාපෘති | 9 |
| 7. අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 10 - 11 |
| 8. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 12 - 15 |
| 9. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය | 16 - 25 |
| 10. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 26 |
| 11. ආදායම් ප්‍රකාශනය | 27 |
| 12. ශේෂ පත්‍රය | 28 - 29 |
| 13. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 30 - 32 |
| 14. ගිණුම්කරණ ප්‍රතිපත්ති | 33 - 45 |
| 15. ගිණුම් සඳහා සටහන් | 46 - 76 |
| 16. විගණකාධිපති වාර්තාව - 2009 | 77 - 92 |

# හැඳින්වීම

තේ ශක්ති අරමුදල යනු වසර 2000 අංක 47 දරණ තේ ශක්ති අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද වාණිජ්‍ය මූල්‍ය ආයතනයක් වන අතර මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටුවා ඇත.

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යභාරය වනුයේ,

- තේ කර්මාන්ත ශාලා දහතුනක් (13) (කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය) ලාභදායී හා උපාය සම්බන්ධී ව්‍යාපාර ඒකක ලෙස ක්‍රියාත්මක කිරීම.

- නිසි කලට පොහොර ලබා දීමේ තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය ගුණාත්මකභාවයට හා විශ්වාසනීයත්වයට හානි නොවන පරිදි ලාභදායී ලෙස පවත්වාගෙන යාම.

- කාර්යක්ෂම ලෙස තේ නිෂ්පාදනය කර දේශීය වෙළඳපොලේ බෙදා හැරීම.

- කුඩා තේ වතු හිමියන් සඳහා සමාජ රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදී පවත්වාගෙව යාම.

මෙම ක්‍රියාදාමයේ ඉලක්කය වනුයේ තේ ශක්ති අරමුදල මගින් කාර්යක්ෂමව හා ඵලදායීව තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම තුළින් කුඩා තේ වතු හිමියන්හට ඔවුන් නිපදවන දළු තේ සඳහා කේවල් කිරීමේ හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමය.

පහත දැක්වෙන සය (6) වැදෑරුම් අරමුණු සාක්සාත් කරගනු වස් තේ ශක්ති අරමුදල ස්ථාපනය කරන ලදි.

- තේ ශක්ති අරමුදලේ තේ කර්මාන්ත ශාලා සඳහා දළු තේ සපයන කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය නගා සිටුවීම සඳහා ඉතිරි කිරීමේ සිරිතට අනුබල දීම හා ඒ සඳහා කුඩා තේ වතු හිමියන් පුරුදු පුහුණු කරවීම.

- තේ කර්මාන්ත ශාලා සඳහා අවැසි යාවත්කාලීන කළ තාක්ෂණ ඥානය සමගින් අඛණ්ඩව තාක්ෂණික දැනුම ලබාදීම හරහා තේ කර්මාන්තයට වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

- අඛණ්ඩ අධීක්ෂණය තුළින් සහ කොළඹ තේ වෙන්දේසිය තුළ සහ දේශීය වෙළඳපළ තුළ තේ ප්‍රමාණය වැඩි කිරීම තුළින් තේ ශක්ති තේ කර්මාන්තශාලා තුළ නිපදවෙන තේ සඳහා වන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම.

- පොහොර කර්මාන්තයේ 2% ක කොටසක් අරමුදල විසින් අත්පත් කරගැනීම සහ එම කොටස නඩත්තු කිරීම.

- කුඩා තේ වතු හිමියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම තුළින් සුභසාධක සමාජ රක්ෂණ ක්‍රමය සඳහා දායක වන ප්‍රතිලාභීන් වන කුඩා තේ වතු හිමියන්ගේ සංඛ්‍යාව උපරිමයක් කරා ගෙන යාම.

- තේ කර්මාන්තයට එල්ලවන අවධානම් හඳුනාගැනීම සහ එම අවධානම ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම සමඟින් 25% අඛණ්ඩව සහ දරණීය වර්ධන වේගයක් ළඟා කර ගැනීම.

ඉහත අරමුණු මෙම වර්ෂය තුළදී සාක්ෂාත් කරගනු වස් තේ ශක්ති අරමුදලේ අභිමතාර්ථ කෙතරම් සාර්ථකව ළඟාකරගත්තේ දැයි යන්නට මෙම වාර්ෂික වාර්තාව සාක්ෂි දරනු ඇත.

# දර්ශනය, මෙහෙවර හා අරමුණු

## දර්ශනය

කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ සමෘද්ධියේ අභිවෘද්ධිය උදෙසා කැපවුණු විශිෂ්ඨත්වයේ කේන්ද්‍රය වීම තේ ශක්ති අරමුදලේ දර්ශනය වේ.

## මෙහෙවර

තේ ශක්ති අරමුදල කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළින් එහි සාමාජිකයන්ගේ සමෘද්ධිය ඇති කිරීම.

## අරමුණු

- කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සාමාජිකත්වය නගා සිටුවීම සඳහා ඉතිරි කිරීමේ සිරිතට අනුබල දීම හා ඒ සඳහා පුරුදු පුහුණු කිරීම.

- තේ කර්මාන්තයට වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

- කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය සඳහා ඇවැසි තේ කර්මාන්තශාලා අත්පත් කර ගැනීම හා වැඩි දියුණු කිරීම හා ඒ සඳහා ඇවැසි අනෙකුත් පහසුකම් සපයාදීම.

- මෙසේ වැඩිදියුණු කළ තේ කර්මාන්ත ශාලා තුළින් නිපදවෙන තේ වල අලෙවි ක්‍රම ප්‍රවර්ධනය කිරීම හා දියුණු කිරීම.

- කුඩා ඉඩම් හිමියන් වශයෙන් තේ නිෂ්පාදනයේ නිරත වී සිටින පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ඇවැසි අනෙකුත් සියළු පියවර ගැනීම.

- තේ කර්මාන්තය සඳහා ඇවැසි පොහොර වර්ග ආනයනය, නිෂ්පාදනය හා විකිණීම.

- රජයට අනුබද්ධිත ශක්තිමත් ස්වීය මූල්‍ය සැපයුම් ආයතනයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම.

- ආයතනයේ ශුද්ධ ලාභය සියයට දහයක (10%) අගයක අඛණ්ඩව පවත්වා ගැනීම.

- නොකඩවා පවත්වාගත් සියයට විසිපහ(25%) ක වර්ධන වේගයක් මුදුන් පමුණුවා ගැනීම.

- උවදුරු, අවධානම්, අනතුරු, ආදිය හඳුනා ගැනීම හා ක්‍රමවත්ව පාලනය කිරීම.

# මූල්‍ය ප්‍රගතිය

| | 2009 | 2008 | 2007 | 2006 | 2005 |
|---|---|---|---|---|---|
| ආදායම (රු මිලියන) | 913.27 | 1183.02 | 1388.47 | 772.27 | 817.10 |
| මෙහෙයුම් සඳහා වියදම් (රු මිලියන) | 770.09 | 1045.73 | 1143.07 | 642.28 | 695.73 |
| දළ ලාභය (රු මිලියන) | 143.17 | 137.28 | 246.4 | 129.99 | 121.38 |
| වෙනත් අදායම් (රු මිලියන) | 34.19 | 17.99 | 12.52 | 8.37 | 19.59 |
| මූල්‍ය පිරිවැය (රු මිලියන) | 6.75 | 11.12 | 0.75 | 0.60 | 12.77 |
| ශුද්ධ ලාභය/අලාභය (රු මිලියන) | (4.73) | (29.40) | 94.46 | 3.63 | 10.69 |
| ලාභාංශ (රු මිලියන) | ශූන්‍ය | ශූන්‍ය | 31.34 | 20.62 | ශූන්‍ය |
| මුළු වත්කම් (රු මිලියන) | 1150.96 | 1188.00 | 1224.01 | 1021.72 | 1027.61 |
| ශුද්ධ වත්කම් (රු මිලියන) | 679.83 | 684.56 | 714.83 | 651.80 | 654.24 |
| යොදවන ලද ප්‍රාග්ධනයට එල( %) | 0.18 | (1.54) | 7.78 | 0.41 | 2.28 |
| දළ ලාභ අනුපාතිකය (%) | 15.68 | 11.60 | 17.75 | 16.83 | 14.85 |
| ශුද්ධ ලාභ අනුපාතිකය (%) | (0.52) | (2.49) | 6.80 | 0.47 | 1.31 |
| ප්‍රවර්තන අනුපාතය (වාර ගණන) | 2.55:1 | 2.29:1 | 2.26:1 | 2.78:1 | 2.70:1 |

# සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| ව්‍යාපාර නාමය | : තේ ශක්ති අරමුදල |
| ලිපිනය | : අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.<br>දුරකථන අංක: 011-2784339, 011-2784340,<br>ෆැක්ස්: 011-2784335,<br>ඊ-මේල්: tsf@teashkthi.gov.lk |
| සංස්ථාපිත කරන ලද පනත | : වර්ෂය 2000 අංක 47 දරණ තේ ශක්ති අරමුදල් පනත |
| සංස්ථාපිත කරන ලද වර්ෂය | : 2000 |
| ව්‍යාපාරයේ ස්වභාවය | : තේ කොමසාරිස්වරයා විසින් පනවන ලද විධි විධාන වලට අනුව 100 % ක් කුඩා තේ වතු හිමියන්ගෙන් මිළ දී ගත් දළු තේ යොදා ගනිමින් තේ නිෂ්පාදනය සහ නෛතික වශයෙන් පිළිගත් මාගී ඔස්සේ නිෂ්පාදිත තේ විකිණීම.<br><br>නිර්දේශිත මිශ්‍රණ අනුපාත වලට අනුව පොහොර මිශ්‍රණ ප්‍රධාන වශයෙන් කුඩා තේ වතු හිමියන් හට සුළු ලාභයකට සැපයීම.<br><br>පාරිභෝගිකයා මූලික තේ සංයෝග දේශීය වෙළඳපොලේ බෙදා හැරීම. |
| විගණක | : විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරු | : ලංකා බැංකුව |

# සභාපතිතුමාගේ පණිවුඩය

2009 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය සහ වාර්ෂික වාර්තාව මවිසින් ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටකිනි.

## තේ කර්මාන්තයේ ගෝලීය තත්ත්වය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ මහා බැංකුවේ සංඛ්‍යාලේඛන වලට අනුව ගෝලීය තේ නිෂ්පාදනය කිලෝග්රෑම් මිලියන 3.860 ක ප්‍රමාණයක් වූ අතර, මෙම ප්‍රමාණය 2008 වර්ෂයේ තේ නිෂ්පාදනයට වඩා කිලෝග්රෑම් මිලියන 4 ක අඩු වීමකි. 2008 වර්ෂයට වඩා වැඩි ප්‍රමාණයක් නිපදවමින් තේ කිලෝග්රෑම් මිලියන 52 කින් ගෝලීය තේ නිෂ්පාදනයට දායක වීමට චීනයට හැකි වුවද, තේ නිෂ්පාදනයේ කැපී පෙනෙන ඌනතාවයක් කලු තේ නිපදවන ප්‍රධාන රටවල් දෙකකින්, නම් වශයේ ශ්‍රී ලංකාවෙන් සහ කෙන්යාවෙන් වාර්තා වූ අතර, මෙම අස්වැන්න ඌනතාවය පිළිවෙළින් කිලෝග්රෑම් මිලියන 29 කින් සහ කිලෝග්රෑම් මිලියන 52 ක් ලෙස ගණන් බලා ඇත.

## ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්තමාන තත්ත්වය

දශක තුනක් පුරා පැතිරුණු කුරිරු යුද්ධයේ නිමාව රට තුළ සාමකාමී කාලපරිච්ඡේදයක් සඳහා මං පෙත් එළිපෙහෙළි වී ඇති අතර, එමගින් ඇතිවෙමින් පවතින්නා වූ දේශපාලන සහ සාර්ව ආර්ථික ස්ථායීතාව මත සමෘද්ධිමත් අනාගතයක යහපත් අපේක්ෂාවන් මල්ඵල ගැන්වෙමින් පවතී.

දශක තුනක් වූ එකිනෙකා නසා ගන්නා ගැටුම් වලින් පසු මෙම දේශය ගැටුම් නිරාකරණය කිරීමේ ආර්ථික සහ දේශපාලන බරින් නිදහස් වී ඇත. රටේ ආර්ථික වර්ධනය වෙනුවෙන් එය සතු සියළු යන්ත්‍ර ක්‍රියා කිරීමෙහි ලා උපරිම අවධානය යොමු කිරීමටත් ඒ සඳහා කේන්ද්‍රගත වීමට සහ කැපවීමටත් පවත්නා තත්ත්ව යටතේ රජයට හැකි විය යුතුය. ආර්ථික වර්ධනයෙහි ලා රටේ වැවිලි කර්මාන්තයට හිමි වනුයේ ඉතාමත් වැදගත් ස්ථානයකි. ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට අනුව මෙම වර්ෂයේ දී සියයට 3.5 ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා විය. 2008 වර්ෂයේ සියයට 6.6 ක ආර්ථික වර්ධන වේගය සසඳා බලන විට මෙම වර්ෂයේ දී රටේ සියළු අංශ වල පැසසිය යුතු කාර්ය සාධන මට්ටමක් ළඟා කරගත සිටිය ද එහි ආර්ථික වර්ධන වේගයේ සිදු වී ඇත්තේ කැපී පෙනෙන පහළ යාමකි. මෙම තත්ත්වයට හේතු ලෙස ගෝලීය ආර්ථික පසුබෑස්ම සහ ලෝකයේ අනෙක් රටවල ගැටුම් උත්සන්න වීම ප්‍රධාන වශයෙන් හුවා දැක්විය හැකිය. රටේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සේවා සැපයීම් යන අංශ තුනෙහි පිළිවෙළින් 3.2% ක, 4.2% ක සහ 3.3% ක ධනාත්මක වර්ධන වේගයක් වාර්තා විය.

**ශ්‍රී ලාංකීය තේ කර්මාන්තය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වලට අනුව මෙම වසරේ දේශීය තේ නිෂ්පාදනය 1999 වර්ෂයේ සිට වාර්තා වූ අඩුම තේ නිෂ්පාදන අගය වන කිලෝග්‍රෑම් මිලියන 289.8 කි. 1999 වර්ෂයේ දී නිෂ්පාදිත තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 283.8 ක් විය. මෙම තේ නිෂ්පාදනයේ වාර්ෂික පහළ බැස්ම ප්‍රතිශතාත්මකව වාර්ෂික 9% අඩුවීමකි.

**තේ ශක්ති අරමුදලේ කාර්යසාධනය**

විගණනය කරන ලද ගිණුම්වලට අනුව මෙම වසරේ දී අරමුදල සැලකිය යුතු වර්ධනයක් ළඟා කරගනිමින් එහි ශුද්ධ අලාභය රුපියල් මිලියන 4.730 ක අගයක් රඳවාගෙන ඇති අතර, පසුගිය වසරේ දී මෙම අරමුදලේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 29.40 ක් විය. අධික භාණ්ඩ මිළ මෙම වර්ෂයේ මුල් කාර්තුවේ පැවති ඉතා දැඩි නියඟය සමඟ පොහොර විකුණුම් වල සිදු වූ පහළ බැසීම නිසා ගොවියන් විසින් දළු තේ සැපයීම අඩුවීම ආදී කරුණු සඳහා ද බලපෑ සාධකය.

2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ සියයට 42 කින් වතු කම්කරුවන්ගේ වැටුප් ඉහළ යාම නිසා ඒ දක්වා අසීරු තත්ත්වයක පසු වූ තේ කර්මාන්තය තවදුරටත් පහළට ඇද වැටිණ. 2009 වර්ෂයේ තෙවන කාර්තුවේ සිට තේ මිළ යහපත් අතට හැරුණ ද ඒ වන විටත් පැවති අස්ථිර සහ අයහපත් කාලගුණ තත්ත්වයන් තේ කර්මාන්තය විසින් මෙම මිළ ඉහළ යාමේ ප්‍රතිලාභ ලබාගැනීම වළක්වා ලන ලදි. 2009 වර්ෂයේ දී තේ ශක්ති අරමුදල විසින් රුපියල් මිලියන 4.57 ක අලාභයක් ලබා ගැනීම මෙම අයහපත් සිද්ධීන් හි සංයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය.

අයහපත් කාලගුණික තත්ත්වයන් මත තේ ශක්ති අරමුදලේ කර්මාන්තශලාවල නිෂ්පාදිත තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 4,087,326.25 සිට කිලෝග්‍රෑම් 2,577,110 ක අගයකට පහළ වැටුණ අතර, කෘෂිකාර්මික දේශගුණික කලාප මත පදනම් වූ ජාතික තේ නිෂ්පාදන පරිමාවේ ද පහළ යාමක් දක්නට හැකිවිය. මෙම වසරේ දී තේ ශක්ති අරමුදල විසින් තේ නිෂ්පාදන උන්නතාංශ සාමාන්‍ය වන රුපියල් 370.50 ට එදිරිව රුපියල් 345.51 ක සමස්ථ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් අත්කර ගන්නා ලදි. අඩු වූ අස්වැන්න සහ කළමනාකරණ මට්ටමේ කර්මාන්තාලා සේවකයන්ගේ පවත්නා ඌනතාවය මෙම දුර්වල විකුණුම් සාමාන්‍ය සඳහා සෘජුව බලපාන්නා වූ සාධක විය.මෙම පහත් ශුද්ධ විකුණුම් සාමාන්‍ය ඉහළ නිෂ්පාදන පිරිවැය සාමාන්‍යයක් වන රුපියල් 359.42 සමඟ එක්වීම මත සිදු වූ අන්තයනගේ සේදී යාම අරමුදල මෙම වර්ෂයේ දී ලද රුපියල් මිලියන 4.7 ක ශද්ධ අලාභයට සෘජුව දායක වී ඇත.

පසුගිය වර්ෂය තුළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයන් 31% කින් පමණ ඉහළ ගිය ද මෙම ඉහළ යාම වර්ෂය තුළ සිදු වූ හානි පූර්ණය සඳහා ප්‍රමාණවත් වී නොමැති සේ තේ ශක්ති අරමුදලට අයත් සියළු කර්මාන්තශාලාවල මෙහෙයුම් 100% ක්ම මිළදී ගන්නා ලබන දළු තේ මත රඳා පවත්නා බැවිනි. කුඩා තේ වතු හිමියන් විසින් සපයන ලද දළු තේ සඳහා ලෙවන ලද ඉහළ මිළ ප්‍රමාණයන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සඳහා බලපෑ අනෙක් ප්‍රධානතම සාධකය වන්නේය.

**අනාගත අපේක්ෂාවන්**

ගෝලීය මූල්‍ය අර්බුදය, ඉහළ යමින් පවතින ඉන්ධන මිළ, දළු තේ සඳහා පවත්නා දැඩි තරඟකාරී බව සහ පුද්ගලික අංශයේ තරඟකරුවන් විසින් තේ නිෂ්පාදනය සඳහා අනුගමනය කරන්නා වූ ආචාරශීලී නොවන පුරුදු වැනි තේ කර්මාන්තය තුළ පවත්නා තත්ත්වයන් යටතේ තේ ශක්ති අරමුදලේ ක්ෂේත්‍රය තුළ පැවැත්ම සහ වර්ධනය සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි කේන්ද්‍රගත වීමක් අනිවාර්යයෙන් සිදු විය යුතුය.

- ❖ අරමුදල සතු වෙළඳපොල කොටස් ප්‍රමාණය ඉහළ නංවා ගැනීම සඳහා විවිධාංගීකරණ ක්‍රමෝපායන් අනුගමනය කිරීම සහ පොහොර සහ දේශීය තේ විකුණුම් ව්‍යාපෘති නැවත ඇගයීමකට ලක් කිරීම. මෙම නැවත ඇගයීම තුළින් මෙම ව්‍යාපෘති සතු සම්පත් ප්‍රශස්ථ මෙහෙයුම් මට්ටමක පවත්වා ගැනීමට හැකි වනු ඇත.

- ❖ දිගු කාලීන වශයෙන් පාඩු ලබන කර්මාන්තශාලා වසා දැමීම හෝ කුලියට දීම සහ දළු තේ සඳහා තරඟකාරීත්වය අඩු ප්‍රදේශවල නව කර්මාන්තශාලා විවෘත කිරීම තුළින් තේ කර්මාන්තශාලා ප්‍රතිසංවිධානය කිරීම.

පැහැදිළි ලෙස සකස් කරන ලද ප්‍රතිපත්ති මාර්ග සූචකයන් නොමැති වීම ඉහත කාර්යභාරයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ලා බාධාවක් වනු ඇත. වැවිලි කර්මාන්ත අංශය තුළ ප්‍රතිපත්තිවල ස්ථිරතාවය යනු ඉතා අපොහොසත් වාර්තාවක් සහිත කලාපයකි. මේ සඳහා තේ ශක්ති අරමුදල විසින් ප්‍රතිපත්තිමය ගැටළු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් ප්‍රගතිය අධීක්ෂණයට අමතරව වැවිලි කර්මාන්ත සහ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන අමාත්‍යවරයා විසින් විධිමත් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා ගත් පියවර මම සාදරයෙන් පිළිගනිමි. මෙම උපාය සම්බන්ධී කේන්ද්‍රගත වීම තුළින් ප්‍රාග්ධනය නර්මාණය කිරීමේ දී සහ දරණීය පදනමක් මත අපගේ අනාගත උපාය සම්බන්ධී ව්‍යපාර ඒකක නිර්මාණය සංවර්ධනය කිරීමේ දී වර්තමානයේ පවත්නා ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කරගනු හැකි වේ යැයි මම විශ්වාස කරමි.

තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තේ කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමියට සහ එතුමියගේ කාර්යමණ්ඩලයට, අපගේ කොටස්කරුවන් හට, කුඩා තේ වතු හිමියන්හට, අපගේ තැරැව්කරුවන් හට සහ පාරිභෝගිකයන් හට ඔවුන් විසින් මෙම වසර තුළ අපවෙත දක්වන ලද අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මාගේ අවංක ඇගයීම ඔවුන් වෙත පිළිගැන්වීම සඳහා මෙම ඉඩ හසර මම අවස්ථාවක් කර ගනිමි.

නොයෙල් පද්මසිරි කාරියවසම්
සභාපති

# තේ ශක්ති ව්‍යාපෘති

| කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය | කළමනාකරු | දුරකථන අංකය |
|---|---|---|
| ප්‍රධාන කළමනාකරු (කම්හල්) | ජී. ජී. කුඩාබණ්ඩා මයා | 0117421141 |
| බලංගොඩ තේ කර්මාන්ත ශාලාව | ඩබ්.ඒ. ධනසිරි | 0457200823 |
| හිනිදුම තේ කර්මාන්ත ශාලාව | එස්.මාගිනාආරච්චි | 0917200537 |
| ඇල්පිටිය තේ කර්මාන්ත ශාලාව | ආර්. ගොඩකන්ද ආරච්චි | 0917200591 |
| කොත්මලේ තේ කර්මාන්ත ශාලාව | කේ. මැදවල | 0547200103 |
| කැප්පෙටිපොල තේ කර්මාන්ත ශාලාව | ඩී. ඊ. පී.ප්‍රේමරත්න | 0577200065 |
| පස්සර තේ කර්මාන්ත ශාලාව | ඒ. යූ. ආර්. වීරසේකර | 0557200174 |
| පන්සල්තැන්න තේ කර්මාන්ත ශාලාව | ඒ. පී. ඩී. කාරියවසම් | 0667200176 |
| දෙණියාය තේ කර්මාන්ත ශාලාව | එස්. බණ්ඩාර | 0417200320 |
| වලහන්දූව තේ කර්මාන්ත ශාලාව | ජේ. ආර්. සෙනෙවිරත්න | 0917200608 |
| ගිලිමලේ තේ කර්මාන්ත ශාලාව | අක්‍රීය තේ කර්මාන්තශාලාවකි. | 0457201524 |
| මහවැලි තේ කර්මාන්ත ශාලාව | කේ. බී. ඇටිපොල | 0547200102 |
| මාවරල තේ කර්මාන්ත ශාලාව | එස්. කේ. ජයවර්ධන | 0417200945 |
| රයිගම්කෝරලේ තේ කර්මාන්තශාලාව | එස්. පී. එදිරිසිංහ | 0347200361 |

## පොහොර ව්‍යාපෘතිය

කළමනාකරු -

| | | |
|---|---|---|
| පොහොර සහ දේශීය තේ අලෙවි | ලක්ෂමන් එදිරිසිංහ | 0117- 421134 |
| පොහොර මිශ්‍රණාගාරය - අරමනාගොල්ල - හොරණ | | 034- 2260563 |

# අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| නොයෙල් පද්මසිරි කාරියවසම් මයා | සභාපති | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය |
| ඊ. එම්.කේ. බී.ඒකනායක මයා | අධ්‍යක්ෂ | ප්‍රධාන ගණකාධිකාරී - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඒ. කුමාරසිරි මයා | අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ - වැවිලි කර්මාන්තඅමාත්‍යාංශය |
| එස්. ඩී. නන්දසේන මයා | අධ්‍යක්ෂ | සාමාන්‍යාධිකාරී - කුඩා තේවතු සංවර්ධන අධිකාරිය |
| නෙවිල් රත්නායක මයා | අධ්‍යක්ෂ | සභාපති, සමස්ථ ලංකා කුඩා තේ වතු සමිති සංවිධානය |
| ජේ. එම්. බී. ජේ. බණ්ඩාර මයා | අධ්‍යක්ෂ | සභාපති - රත්නපුර - තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| කුමාර ගුණසිංහ මයා | අධ්‍යක්ෂ | සභාපති - නුවරඑළිය තේ වතු ප්‍රාදේශීය සමිති සමිති සංවිධානය |
| බණ්ඩාර ගුණසේකර මයා | අධ්‍යක්ෂ | සභාපති- ඌව - තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |
| ජී. ජී. සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ | සභාපති- මහනුවර - තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |
| ජී. ඩබ්. ජයවර්ධන මයා | අධ්‍යක්ෂ | සභාපති- ගාල්ල තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |
| කේ. එල්. ගුණරත්න මයා | අධ්‍යක්ෂ | සභාපති - කළුතර තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |
| එන්. එම්. ආර්. ජයතිලක මයා | අධ්‍යක්ෂ | සභාපති - කෑගල්ල තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |

## විගණන සහ කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| ඒ. කුමාරසිරි මයා | සභාපති | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඊ. එම්.කේ. බී.ඒකනායක මයා | අධ්‍යක්ෂ සහ සාමාජික | ප්‍රධාන ගණකාධිකාරී<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| නෙවිල් රත්නායක මයා | අධ්‍යක්ෂ සහ සාමාජික | සභාපති, සමස්ථ ලංකා කුඩා තේ<br>වතු සංවර්ධන සමිති සංවිධානය |
| එම්. එන්. ආර්. ජයතිලක මයා | අධ්‍යක්ෂ සහ සාමාජික | සභාපති - කෑගල්ල තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය |

## ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්

| | |
|---|---|
| ඒ. ජේ. එම්. ඩී. පී. බී. අව්රුප්පොල මයා | ප්‍රධාන විධායක නිලධාරී |
| ජී. ජී. කුඩා බණ්ඩා මයා | ප්‍රධාන කම්හල් (කළමනාකරු ) |
| පී. පී. ආර්. තිස්ස මයා | ප්‍රධාන ගණකාධිකාරී |
| පී. අබේනායක මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ඊ. ඒ. එල්. එදිරිසිංහ මයා | කළමනාකරු - පොහොර හා දේශීය තේ අලෙවි |
| එස්. පී. එදිරිසිංහ මයා | ජ්‍යේෂ්ඨ කළමනාකරු - රයිගම් කෝරළේ තේ කම්හල |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2009 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ කාර්ය සාධනය පිළිබඳව අප වාර්තා කරනුයේ කෘතඥතා පූර්වක සතුටක් පෙරදැරිවය. වැඩිවන සේවක වැටුප් සහ අනෙකුත් ආශ්‍රිත පිරිවැය ඉහළයාම් මධ්‍යයේ වුවද තේ ශක්ති අරමුදලේ කටයුතු පසුගිය වසර සමඟ සසඳා බලන විට යුක්තියුක්ත ලෙස කළමනාකරණය කර ඇත.

**මූලික ක්‍රියාකාරකම්**

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන සහ මූලික ක්‍රියාකාරකම් 8 වන පිටුවේ විස්තර කර ඇති අතර, සලකා බලනු ලබන වසර තුළදී මෙම ක්‍රියාකාරකම්වල ස්වභාවයේ කැපී පෙනෙන වෙනසක් සිදු වී නොමැත.

**මෙහෙයුම් ආදායම**

වර්ෂය තුළ මෙහෙයුම් අයභාරය සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල මෙම වාර්තාවේ 5 සහ 6 වන පිටුවල දැක්වෙන තේ ශක්ති අරමුදලේ සභාපතිතුමාගේ පණිවුඩයේ ඇතුළත් වන අතර, මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය මෙම වාර්තාවේ 17 – 22 පිටු වල දක්වා ඇත.

**අනාගත සංවර්ධනය**

කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක වල සිටින කුඩා තේ වතු හිමියන් වෙත ළඟා වීම සඳහා දැරණියගල සහ යටිනුවර තේ කර්මාන්ත ශාලා සම්පූර්ණ කර විවෘත කිරීමට තේ ශක්ති අරමුදල සැලසුම් කර ඇත.

**විගණන කමිටුව**

විගණන කමිටුවට ඇතුළත් සියළු සාමාජිකයන් විධායක අධ්‍යක්ෂවරුන් නොවන අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මෙම වාර්තාවේ 23 වන පිටුවට ඇතුළත් කර ඇත.

## ලාභ සහ විසර්ජන

2008 හා 2009 වර්ෂ වල පිරිවැය සහ මෙහෙයුම් වලින් ලද ලාභයේ විස්තර පහත පරිදි වේ.

| | 2009 (රුපියල්) | 2008(රුපියල්) |
|---|---|---|
| ආදායම | 913,266,846 | 1,183,002,981 |
| වෙන්දේසියේ විකුණුම් ආදායම | 753,598,779 | 1,003,273,979 |
| දේශීය තේ විකුණුම් | 31,721,364 | 36,743,268 |
| පොහොර විකිණීම | 127,946,703 | 142,985,734 |
| වෙනත් ආදායම් | 34,193,796 | 17,996,555 |
| ශුද්ධ ආදායම | 177,369,111 | 155,272,827 |
| ආයතන හා පරිපාලන වියදම් | (155,675,670) | (143,954,398) |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (19,672,776) | (29,597,332) |
| බදු පෙර මෙහෙයුම් ලාභය | 2,020,665 | (18,278,902) |
| මූල්‍ය වියදම් | (6,751,368) | (11,125,942) |
| රැඳවාගත් ලාභය | 19,494,078 | 24,224,781 |

### ලාභාංශ සහ සංචිත

සමාලෝචනය කරමින් පවතින වර්ෂය තුළ ලාභාංශ ප්‍රකාශයට පත් කර නැත.

### සංචිත

2009 දෙසැම්බර් මස 31 වන දිනට තේ ශක්ති අරමුදල සතු මුළු සංචිත ප්‍රමාණය රුපියල් 33,364,252.00 මෙය 2008 වර්ෂයේරුපියල් 38,094,954.00 කි.) වන අතර, සංචිතවල හැසිරීම 39 වන පිටුවේ දක්වා ඇත.

### සංස්ථාපිත සහනාධාර

2009 වර්ෂය තුළ සංස්ථාපිත සහනාධාර කිසිවක් ලැබී නොමැත.

### ප්‍රාග්ධන පිරිවැය

තේ ශක්ති අරමුදල සතු දේපළ සහ යන්ත්‍ර සූත්‍ර ආදිය පිළිබඳ විස්තර සටහන් අංක 3 සහ 52 යන පිටුවල දක්වා ඇත.

**නිශ්චල දේපළ වල වෙළඳපළ අගය**

2009 දෙසැම්බර් මස 31 වන දිනට සටහන් අංක 3 සහ පිටු 52 යන පිටුවල සඳහන් කර ඇති වත්කම් හැර වෙනත් කිසිම නිශ්චල දේපළක් තේ ශක්ති අරමුදල සතුව නොමැත.

**දායක ප්‍රාග්ධනය**

රට පුරා විසිරී සිටින කුඩා තේ ශක්ති අරමුදල විසින් 2009 වර්ෂයේදී රුපියල් 208,959,130 ක ප්‍රාග්ධනයක් සඳහා දායක වී ඇත.(2009 වර්ෂයේදී මෙම ප්‍රාග්ධනය රුපියල් 208,959,130 කි.)

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සේවකයන් වෙනුවෙන් තේ ශක්ති අරමුදල විසින් ගෙවිය යුතු සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් 2009 වර්ෂය සඳහා ගෙවා නිමකොට ඇති බවට සියළු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ හැටියට සෑහීමකට පත් වී ඇත.

**බදුකරණය**

තේ ශක්ති අරමුදල විසින් ශ්‍රී ලාංකීය කෘෂිකර්ම අංශයට ලබා දී ඇති අවුරුදු 10 ක ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ වරප්‍රසාදය භුක්ති විදින බැවින් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් බදු සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.

**නීති හා රෙගුලාසි වලට අනුකූලතාව දැක්වීම.**

අප දන්නා පරිදි තේ ශක්ති අරමුදල තුළ කිසියම් අධිකරණ පාත්‍රතාවක් තුළ බලපෑම් ප්‍රකාශයට පත්කළ යුතු හෝ මූල්‍ය ප්‍රකාශනය තුළ ද්‍රව්‍යමය මූල්‍ය ගැලපීමකට තුඩු දෙන්නා වූ නීති හෝ රෙගුලාසි කඩවීමක් වර්ෂය තුළදී සිදු වී නොමැත.

**අධ්‍යක්ෂවරු**

තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර 10 වන පිටුවේ දක්වා ඇත

**ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම.**

2009 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ දී තේ ශක්ති අරමුදල විසින් ඇති කරගත් හෝ ඇති කර ගැනීමට නියමිත වූ ගිවිසුම් සඳහා අරමුදලේ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.සියළු අධ්‍යක්ෂවරු තමන් විසින් දරන්නා වූ අනෙකුත් අධ්‍යක්ෂ තනතුරු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල දැන්වීම් වලදී දැනුවත් කර ඇති අතර, එම නිසා ඔවුන්හට බැඳීමක් ඇති කරුණු වලදී ඔවුන් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිට ඇත.

**පරිසර සංරක්ෂණය**

තේ ශක්ති අරමුදලේ සියළු ව්‍යාපාරික කටයුතු යම් හෝ විධියකින් පරිසරයට බලපෑම් කරනු ඇත. එම ව්‍යපාර කටයුතු වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සහ ඒ හා සම්බන්ධ අධිකාරීන්ට සහ රෙගුලාසිවලට දක්වන සහයෝගය සහ අනුකූලතාව ප්‍රවර්ධනය කිරීමත් තේ ශක්ති අරමුදලේ ප්‍රතිපත්තිය වේ.

**ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුළ ප්‍රකාශයට පත්කළ යුතු හෝ ද්‍රව්‍යමය ගැලපීම් සිදුකළ යුතු සිදුවීම් කිසිවක් ශේෂ පත්‍රය පිළියෙළ කරනු ලබන දිනයේදී සිදු වී නොමැත.

**අඛණ්ඩභාවය(Going Concern)**

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයකින් පසු සහ කුඩා තේ වතු හිමියන්ගේ සහභාගීත්ව පුරෝකථන, අයවැය ලේඛන, ණය ගැනීමේ අවශ්‍යතාවන්, පවත්නා හිමිකම් සහ සම්භාව්‍යතාවන්, වෙනස් වන ව්‍යාපාර තත්ත්වයන් සඳහා ඇවැසි මූල්‍ය නව්‍යතාව, කළමනාකරණ ක්‍රමෝපායන් සහ ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් සහ තර්ජන යන සාධක සලකා බැලීමෙන් පසු ද්‍රව්‍යමය වශයෙන් මෙහෙයුම් මෑතකාලීනව සීමා නොකොට ආයතනයේ මෙහෙයුම අනාගතය තුළද පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් තේ ශක්ති අරමුදල සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව ඇත. එම නිසා මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී අඛණ්ඩභාවය යන මූලධර්මය මත පිහිටා කටයුතු කර ඇත.

**සියළු කොටස්කරුවන්හට සම සාධාරණ වීම.**

සියළු කොටස්කරුවන් විසින් අරමුදලට දක්වන අනුග්‍රහය ඉතා අගය කොට සලකන අතර, සියළු කොටස්කරුවන්ට අපක්ෂපාතීව සහ සමසාධාරණව සැලකීම සඳහා අරමුදල විසින් සියළු ප්‍රයත්නයන් දරණ ලදි.

**විගණකවරු**

2009 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයේ විගණනය විගණකාධිපතිවරයාගේ උපදෙස් මත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ ජේද අංක 154 (1) හි ඇති ප්‍රතිපාදන සහ 1971 අංක 38 දරණ මුදල් ආඥා පනතේ 13 (1) වගන්තිය ප්‍රකාර ප්‍රතිපාදන සමඟ ක්‍රියාවට නංවමින් සිදුකර ඇත.

# මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

සමාලෝචනය කරමින් පවතින වර්ෂය සඳහා තේ ශක්ති අරමුදල විසින් රුපියල් මිලියන 2 ක මෙහෙයුම් ලාභයක් 2008 වසරේ වාර්තා කරන ලද රුපියල් මිලියන 18.3 ක අලාභයට එරෙහිව උපයා ගන්නා ලදි. මෙම අගය පසුගිය වසරට වඩා 110% ක වැඩිවීමක් නියෝජනය කරයි. එනමුදු බදු පෙර ලාභය 84% කින් පහළ බැස ඇත.

## තැරැව්කරුවන් මගින් විකුණුම් ආදායම

තැරැව්කරුවන් මගින් කරන ලද විකුණුම් වලින් ලත් ලාභය 25% කින් 2008 වර්ෂයේ ලබාගත් රුපියල් මිලියන 1003.27 ක ආදායමේ සිට 2009 වර්ෂයේ දී රුපියල් මිලියන 753 දක්වා පහතට වැටී ඇත.අඩු අස්වැන්න නිසා අඩු වූ නිෂ්පාදිත තේ ප්‍රමාණය සහ එම නිසා ඇති වූ පහළ විකුණුම් සමාන්‍ය මෙම විකුණුම් ප්‍රමාණයේ පහළ යාම සඳහා සෘජුව බලපා ඇත.

## කර්මාන්තශාලා ව්‍යාපෘතිය මූල්‍ය කාර්ය සාධනය

## 2009 වර්ෂය (රුපියල් මිලියන)

| | දෙනියාය | මාවරල | ඇල්පිටිය | බලන්දූව | හිනිදුම | රයිගම් කෝරළය | බලන්ගොඩ | මොරවක | ගිලීමලේ | පන්සල්තැන්න | කොත්මලේ | කැප්පෙටිපොල | පස්සර | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 108.9 | 45.2 | 52.9 | 71.3 | 15.1 | 123.9 | 3.6 | 105.5 | 0.1 | 24.1 | 44.1 | 75.2 | 110.2 | **780.0** |
| විකුණුම් පිරිවැය | (87.9) | (38.9) | (50.8) | (57.6) | (15.5) | (93.6) | (6.1) | (89.3) | (1.2) | (18.5) | (39.9) | (58.0) | (81.8) | **(639.1)** |
| දායක මුදල් | 21.0 | 6.3 | 2.1 | 13.6 | (0.5) | 30.3 | (2.4) | 16.2 | (1.1) | 5.6 | 4.2 | 17.2 | 28.4 | **140.9** |
| කර්මාන්තශාලා සෘජු වියදම් | (9.8) | (9.5) | (7.8) | (9.9) | (4.9) | (8.4) | (5.4) | (10.3) | (2.4) | (8.9) | (8.4) | (5.6) | (8.8) | **(100.1)** |
| විකුණුම් සහ බෙදා හැරීමේ වියදම් | (1.8) | (0.7) | (1.0) | (1.0) | (0.3) | (2.5) | (0.1) | (2.2) | (0.1) | (1.2) | (1.2) | (2.1) | (2.3) | **(16.5)** |
| අනෙකුත් ආදායම් | 0.9 | 4.7 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 0.7 | 0.9 | 0.9 | 0.9 | 0.9 | **15.5** |
| දළ ලාභය | 10.3 | 0.7 | (5.7) | 3.7 | (4.8) | 20.3 | (7.0) | 4.7 | (2.9) | (3.6) | (4.5) | 10.4 | 18.2 | 39.8 |
| පාලන වියදම් | (3.6) | (1.5) | (2.0) | (2.4) | (1.0) | (4.2) | (0.3) | (4.3) | - | (1.0) | (1.9) | (3.0) | (4.1) | (29.3) |
| මූල්‍ය පිරිවැය | (0.6) | (0.4) | (0.5) | (0.5) | (0.3) | (0.5) | (0.6) | (0.6) | | (0.5) | (0.5) | (0.4) | (0.6) | **(6.3)** |
| වාර්ෂික ලාභය | 6.1 | (1.2) | (8.2) | 0.7 | (6.1) | 15.6 | (8.0) | (0.2) | (2.9) | (5.2) | (6.9) | 6.9 | 13.5 | 4.1 |
| දළ ලාභ අනුපාතය (%) | 9.5 | 1.6 | (10.8) | 5.1 | (31.7) | 16.4 | (192.3) | 4.5 | (2,258.8) | (15.0) | (10.2) | 13.8 | 16.5 | 5.1 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 5.6 | (2.7) | (15.6) | 1.0 | (40.3) | 12.6 | (219.1) | (0.2) | (2,258.8) | (21.4) | (15.7) | 9.2 | 12.3 | 0.5 |
| නිෂ්පාදිත තේ | 320,422 | 135,765 | 178,521 | 215,418 | 86,098 | 373,228 | 30,799 | 381,466 | | 89,759 | 170,888 | 266,069 | 364,673 | **2,613,106** |
| දළ ලාභය/කිලෝ ග්‍රෑම් | 32.3 | 5.4 | (32.0) | 17.0 | (55.5) | 54.4 | (226.6) | 12.3 | | (40.4) | (26.3) | 38.9 | 50.0 | 15.2 |
| ශුද්ධ ලාභය/කිලෝ ග්‍රෑම් | 17.5 | (19.8) | (87.2) | 4.7 | (468.3) | 33.7 | (7,114.6) | (0.5) | | (238.4) | (92.1) | 34.7 | 33.6 | 0.2 |

### නිමි තේ නිෂ්පාදනය

වසරේ අවසාන කාර්තුව තුළ පැවතුන අයහපත් වියළි කාලගුණ තත්ත්වයන් නිසා පහතරට සහ මැදරට තේ වැවුම් කලාප තුළ දළු තේ සැපයුමේ අඩුවක් වාර්තා විය. 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ 5 ක කාලය තුළ දළු තේ සැපයුමේ සහ නිමි තේ නිෂ්පාදනයේ සංසන්දනයක් පහත වගුවේ දක්වා ඇත.

| වර්ෂය | දළු තේ සැපයුම් (කිලෝග්රෑම්) | නිමි තේ (කිලෝග්රෑම්) |
|---|---|---|
| 2009 | 12,223,467 | 2,613,342 |
| 2008 | 19,078,944 | 4,087,507 |
| 2007 | 20,932,625 | 4,498,378 |
| 2006 | 18,007,591 | 3,753,607 |
| 2005 | 19,226,865 | 4,065,459 |

## කර්මාන්තශාලා වල භෞතික කාර්ය සාධනය - 2009 වර්ෂය

| කර්මාන්තශාලාව | දළු තේ | | නිමි තේ | | නිමැවුම % | | ශු.වි.සා. (රු) | | නිෂ්පාදන පිරිවැය | කර්මාන්තශාලා ධාරිතාව නිමි තේ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ධාරිතාව | සත්‍ය | ධාරිතාව | සත්‍ය | ධාරිතාව | සත්‍ය | ධාරිතාව | සත්‍ය | සත්‍ය | කර්මාන්තශාලා ධාරිතාව නිමි තේ |
| පස්සර | 1,800,000 | 1,615,684 | 387,000 | 364,673 | 21.5 | 22.57 | 329.89 | 330.90 | 282.45 | 0.94 |
| කැප්පෙටිපොල | 1,800,000 | 1,193,267 | 387,000 | 266,069 | 21.5 | 22.3 | 329.89 | 316.59 | 277.64 | 0.69 |
| රයිගම් කෝරලේ | 3,300,000 | 1,746,707 | 709,500 | 373,228 | 21.5 | 21.37 | 387.70 | 339.00 | 355.01 | 0.53 |
| පන්සල්තැන්න | 2,688,000 | 395,222 | 578,064 | 89,759 | 21.5 | 21.08 | 387.70 | 298.95 | 316.30 | 0.16 |
| ඇල්පිටිය | 3,300,000 | 865,239 | 709,500 | 178,521 | 21.5 | 20.63 | 387.70 | 351.90 | 395.55 | 0.21 |
| ගිලීමලේ | 1,176,000 | 1,267 | 252,900 | 253 | 21.5 | 19.97 | 387.70 | N/A | 6598.32 | Nil |
| කොත්මලේ | 2,100,000 | 801,561 | 451,500 | 170,888 | 21.5 | 21.32 | 387.70 | 267.59 | 283.85 | 0.38 |
| බලන්ගොඩ | 2,688,000 | 151,794 | 578,064 | 30,799 | 21.5 | 21.47 | 392.48 | 254.99 | 316.03 | 0.05 |
| මහවැලි | 3,600,000 | 1,770,202 | 77,400 | 381,466 | 21.5 | 21.4 | 311.22 | 295.63 | 281.42 | 0.49 |
| දෙනියාය | 2,100,000 | 1,540,691 | 451,500 | 320,725 | 21.5 | 20.8 | 387.70 | 384.78 | 360.44 | 0.71 |
| මාවරල | 2,400,000 | 656,593 | 516,000 | 135,765 | 21.5 | 20.68 | 387.70 | 387.37 | 394.99 | 0.26 |
| වලහන්දූව | 2,400,000 | 1,035,305 | 516,000 | 215,419 | 21.5 | 20.8 | 387.70 | 388.80 | 384.38 | 0.42 |
| හිනිදුම | 2,688,000 | 422,873 | 578,064 | 86,080 | 21.5 | 30.36 | 387.70 | 367.49 | 422.10 | 0.20 |




ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වලට අනුව මෙම වසරේ නිමි තේ නිෂ්පාදනය 2007 වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 3 කින් පහළ වැටී ඇත. මෙම පහළ යාම 2008 වසරේ දී වාර්තා වී ඇත්තේ කිලෝග්‍රෑම් මිලියන 2.62 ක් ලෙසත් මේ අනුව 2008 වසරට සාපේක්ෂව 2009 වර්ෂයේ දී නිමි තේ නිෂ්පාදනයේ ප්‍රතිශතාත්මක පහළ යාම 44% ක් වූ අතර, මෙම නිමි තේ නිෂ්පාදනයේ පහළ බැස්මට ප්‍රධාන සාධකය වී ඇත්තේ කුඩා තේ වතු අස්වැන්න අඩු වීමයි. මෙම වසරේ දී පහතරට කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය පසුගිය වසරට වඩා කිලෝග්‍රෑම් මිලියන 14 කින් අඩු වී ඇත. පහතරට ප්‍රදේශවල අයහපත් වියළි කාලගුණය සහ ඒ හා ඈඳුණු අඩු වූ පොහොර භාවිතය මෙම නිෂ්පාදන පහත යාම සඳහා ඍජුව දායක වී ඇත.

## ශුද්ධ විකුණුම් සාමාන්‍යයන්

පහතරට වැඩුණු තේ වල මිළ දිගින් දිගටම ආකර්ෂණීය මට්ටමක පැවතිය ද කුඩා තේ වතු අංශයේ දළු තේ සැපයුමෙහි පහත වැටීම අරමුදල සතු සියළු තේ කර්මාන්තශාලාවන්හි මෙහෙයුම් වෙත ඍජු අයහපත් බලපෑමක් ඇති කළේය. මෙම තේ කර්මාන්තශාලා 100% ක් මිළදී ගත් දළු තේ මත යැපීම මෙම තත්ත්වයට හේතු සාධක විය. මෙම නිෂ්පාදන නිමි තේ වල පහත යාම ශුද්ධ විකුණුම් සාමාන්‍යයට ද සහ නිෂ්පාදන පිරිවැය මත අනර්ථකාරී බලපෑම් ඇති කිරීමෙන් අරමුදලේ අන්තයන් සෝදා පාලුවකට ලක් වූ අතර එම නිසා කර්මාන්තශාලා ව්‍යාපෘතියේ සමස්ථ කාර්යසාධනය ද පහත වැටිණ.

| වර්ෂය | ශුද්ධ විකුණුම් සාමාන්‍යය (N. S. A.) කිලෝග්‍රෑම්/රුපියල් | නිෂ්පාදන පිරිවැය (C. O. P.)කිලෝග්‍රෑම් 1 ක් සඳහා |
|---|---|---|
| 2005 | 166.22 | 168.73 |
| 2006 | 174.47 | 184.35 |
| 2007 | 268.34 | 252.57 |
| 2008 | 268.51 | 289.51 |
| 2009 | 346.84 | 337.04 |




අරමුදල සතු ක්‍රියාකාරී තත්ත්වයේ පවත්නා තේ කර්මාන්තශාලා දොලසෙන් දෙනියාය, කැප්පෙටිපොල, මහවැලි, පස්සර, රයිගම් කෝරලේ සහ වලහන්දුව තේ කර්මාන්තශාලා හැරුණු විට අනෙකුත් බලංගොඩ, ඇල්පිටිය, හිනිදුම, කොත්මලේ, මාවරල සහ පන්සල්තැන්න යන කර්මාන්තශාලා හය විසින් වසර තුළ දරණ ලද මුළු අලාභය රුපියල් මිලියන 25.7 කි.

කළමනාකාරීත්වය විසින් මෙම තත්ත්වය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වන අතර, මෙම අලාභය හා සම්බන්ධ පිරිවැය සංචරක හා මෙහෙයුම් කරුණු පිළිබඳව පරීක්ෂණයක් සඳහා යොමු වී ඇත. කවද කර්මාන්තශාලා තුළ පවත්නා අඩු වැටුප් සහ දැනට පවත්නා කර්මාන්තශාලා කළමනාකරුවන් ඇතුළු පුහුණු කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය ඌනතාවයන් ද කර්මාන්තශාලා ව්‍යාපෘතියේ අයහපත් කාර්යසාධනය කෙරෙහි තදින් බලපා ඇත. මෙම තත්ත්වයෙන් මිදීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් මත කර්මාන්තශාලා ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කිරීමක් ඇවැසි වන්නේය.

## කර්මාන්තශාලා ව්‍යාපෘතියේ ලාභදායී බව

සමාලෝචනය කරමින් පවතින වර්ෂය තුළ දී තේ ශක්ති අරමුදල සතු දෙනියාය, කැප්පෙටිපොල, මහවැලි, පස්සර, රයිගම් කෝරලේ සහ වලහන්දුව යන කර්මාන්තශාලා හය මගින් අරමුදලේ දළ ලාභයට දායක කළ මුදල රුපියල් මිලියන 38.91 කි. මෙම මුදල ඊට පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 42.47 ක වැඩි වීමකි:

එසේ නමුදු මෙම වැඩිවීම අනෙකුත් කර්මාන්තශාලා පහෙන් සිදු වූ පාඩුව පූර්ණය කිරීමට සහ පාලන පිරිවැය පියවා ගැනීමට කරම් ප්‍රමාණවත් නොවේ. මෙම වාර්තාවේ පිටු අංක 13 හි දක්වා ඇති පරිදි දළු තේ සැපයීම සඳහා කුඩා තේ වතු හිමියන්ගෙන් වූ දායකත්වයේ පහළ යාම තේ ශක්ති කර්මාන්තශාලා ව්‍යාපෘතියේ ආදායම් වර්ධනය සඳහා බාධා පමුණුවා ඇත. තවද ගිලීමලේ තේ ශක්ති කර්මාන්තශාලාව මෙම වසර තුළ අක්‍රියව පැවතිණ. මේ තේ කර්මාන්ශාලාව එම ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගේ සංගමයට කුලියට දීම සඳහා කළමනාකාරිත්වය මේ වන විට සාකච්ඡා පවත්වා ඇත.

## දේශීය නිමි තේ විකුණුම්

තේ කර්මාන්තශාලා සහ ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන තේ ශක්ති අරමුදල සතු දේශීය තේ විකුණුම් ව්‍යාපෘතියේ අලෙවිකරණ හස්ථය තේ විකුණුම් ප්‍රවර්ධනය කරනු වස් පාරිභෝගිකයින් වෙත ළඟා වීම සඳහා ක්‍රමෝපායන් සකසා ඇත. මෙම ව්‍යාපෘතිය මගින් වර්ෂය තුළදී රුපියල් මිලියන 27.54 ක මුදලක් තේ විකුණුම් කර ඇති අතර, මෙයින් රුපියල් මිලියන 22.25 ක මුදලක් කර්මාන්තශාලා යටතේ කළ විකිණීම් තුළින් ලබා ගත් අතර, රුපියල් මිලියන 5.29 ක මුදලක් ප්‍රධාන කාර්යාලය යටතේ කළ නිමි තේ විකිණීම් තුළින් ලබා ගෙන ඇත. වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 1.58 ක දළ ලාභයක් උපයාගෙන ඇත. එසේ නමුදු මෙම දළ ලාභය ඊට පෙර වසරට සාපේක්ෂව 14% කින් පහළ යාමකි. තම නිෂ්පාදන බෙදාහැරීම සඳහා ව්‍යාපෘතිය සතුව සුදුසු අලෙවිකරණ යාන්ත්‍රණයක් නොමැති වීම තේ විකුණුම් වල සහ ලාභයේ පහළ යාම සඳහා තදින් බලපා ඇති සාධකයකි. මෙම තත්ත්වය මගහැරවීම සඳහා පියවර ගනිමින් සිටින අතර, තේ ශක්ති අරමුදලේ සංශෝධිත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලැබුණු විගස මෙම පියවරයන් අවසානයකට ගෙන එනු ඇත.

## පොහොර ව්‍යාපෘතිය

මෙම වසර තුළදී පොහොර ව්‍යාපෘතිය විසින් පසුගිය වසරේ දී වාර්තා කරන ලද රුපියල් මිලියන 37.35 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව රුපියල් මිලියන 5.42 ක ශුද්ධ අලාභයක් ලබා ගෙන ඇත. 12% වශයෙන් අවුරුද්දෙන් අවුරුද්ද පහත වැටුණු ආදායම සහ සෘජු විකුණුම් පිරිවැයෙහි 28% ක ඉහළ යාම මෙම අලාභය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

### තේ අංශයේ පොහොර යෙදීම සහ තේ ශක්ති පොහොර විකුණුම් සංසන්දනය

| වර්ෂය | පොහොර යෙදීම (Fertilizer Application) (මෙට්‍රික් ටොන් 000) | තේ ශක්ති පොහොර විකුණුම් (Fertilizer Sales) (මෙට්‍රික් ටොන් 000) |
|---|---|---|
| 2005 | 178.2 | 5.6 |
| 2006 | 165.4 | 4.4 |
| 2007 | 157.2 | 3.8 |
| 2008 | 131.8 | 2.0 |
| 2009 | 137.0 | 2.2 |




| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|
| ■ Fertilizer Application (MT) | 178.2 | 165.4 | 157.2 | 131.8 | 137 |
| ■ Fertilizer Sales (MT) | 5.6 | 4.4 | 3.8 | 2 | 2.2 |

**<u>රජයේ පොහොර සහනාධාර ක්‍රමය යටතේ කෘෂිකර්ම අංශය සඳහා නිර්දේශිත පොහොර යෙදීම සහ සහනාධාර ක්‍රමය යටතේ තේ ශක්ති පොහොර විකිණීම සංසන්දනය කිරීම.</u>**

| වර්ෂය | කෘෂිකර්ම අංශය සඳහා නිර්දේශිත [Recom. QT for Agriculture(MT)] පොහොරප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | තේ ශක්ති පොහොර [Tea Shakthi Sales(MT)] විකුණුම් (මෙට්‍රික් ටොන් 000) |
|---|---|---|
| 2005 | ක්‍රියාත්මක කර නොමැත. | ------- |
| 2006 | 43,982 | 2,690 |
| 2007 | 51,917 | 2,875 |
| 2008 | 51,590 | 1,533 |
| 2009 | 136,900 | 1,888 |




### සුභසාධන ව්‍යාපෘතිය

කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධනය සඳහා කැපවුණු එකම සමාජ සුභසාධන හස්තය මෙම සුභසාධන ව්‍යාපෘතිය වන්නේය. මෙම සුභසාධන ව්‍යාපෘතියේ සාමාජිකත්වය ජීවිත කාලය පුරාවටම ලබාගැනීම සඳහා එක් වරක් ගෙවන රුපියල් 2400 ක සාමාජික ගාස්තුවක් ගෙවිය යුතුය. පසුගිය වසර පහ තුළ මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත වගුව තුළ දක්වා ඇත.

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව | රක්ෂණ වාරික (රුපියල්) | ගෙවන ලද ප්‍රතිලාභ ගණන | ප්‍රතිලාභවල ප්‍රතිලාභ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| 2005 | 95,000 | 8.9Mn | 425 | 11.62Mn |
| 2006 | 95,000 | 9.8Mn | 413 | 11.62Mn |
| 2007 | 94650 | 8.9Mn | 947 | 20.34Mn |
| 2008 | 89043 | 8.3Mn | 883 | 18.60Mn |
| 2009 | 91350 | 10.8Mn | 696 | 14.80Mn |

### කුඩා තේ වතු හිමියන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය

අවුරුදු 18 ත් 60 ත් අතර වයසේ පසුවන සුභසාධක රක්ෂණ ක්‍රමයේ සාමාජිකයන් වන කුඩා තේ වතු හිමියන්, ඔවුන් වෙනත් විශ්‍රාම වැටුපකට දායක වී නොමැති නම් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට සුදුසුකම් ලබනු ඇත. මෙසේ සාමාජිකයන් වුවත් ඔවුන් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට ඔවුන් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූ මුදල මත තීරණය වූ මාසිකව ගෙවන විශ්‍රාම වැටුපක් ලබන්නේය. පසුගිය වර්ෂ 3 මත මෙසේ ගෙවන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාණය පහත දක්වා ඇත.

| වර්ෂය | ගෙවන ලද විශ්‍රාම වැටුප් (රුපියල්) |
|---|---|
| 2007 | 42,174 |
| 2008 | 172,571 |
| 2009 | 1,681,940 |

## පිරිවැටුප සඳහා පාර්ශ්වික දායකත්වය

පසුගිය වසර 5 ක කාලය තුළදී අරමුදලේ සතු ව්‍යාපෘති 3 මගින් අරමුදලේ පිරිවැටුප සඳහා කරන ලද පාර්ශ්වික දායකත්වය පහත දක්වා ඇත.

| කොටස | 2009 | 2008 | 2007 | 2006 | 2005 |
|---|---|---|---|---|---|
| තැරැව්කරුවන් මගින් විකුණුම් **Broker Tea Sales (Rs.Mn)** | **753.60** | **1003.3** | **1201.21** | **641.75** | **691.33** |
| දේශීය තේ විකුණුම් **Local Tea Sales (Rs.Mn)** | **31.73** | **36.12** | **32.47** | **17.78** | **23.42** |
| පොහොර විකුණුම් **Fertilizer Sales (Rs.Mn)** | **124.11** | **86.28** | **109.05** | **95.59** | **92.25** |




රූප සටහනේ දක්වා ඇති පරිදි තැරැව්කරුවන් මගින් කරන ලද තේ විකුණුම් 2007 වර්ෂයේ සිට ක්‍රමයෙන් පහත ගොස් ඇති අතර, දුර්වල දළු තේ සැපයුම නිසා මෙය සිදු වී ඇත. තවද නිෂ්පාදිත නිමි තේ සහ පොහොර දේශීය වෙළඳපොල තුළ බෙදා හැරීම සඳහා ක්‍රමවත් අලෙවිකරණ යාන්ත්‍රණයක් නොමැති වීම මෙම ව්‍යාපෘති යුග්මයෙහි විකුණුම් වර්ධනය කිරීමෙහි ලා ප්‍රබල බාධකයක් වී ඇත. තම බෙදාහැරීමේ මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘති දෙක මූලික කටයුතු සූදානම් කර ඇති අතර, යෝජිත නව සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලද විගස මෙම කටුයුතු අවසානයක් කරා ගෙන එනු ඇත.

**ආදායම සහ සමස්ථ ලාභදායීතාව**

| | 2009 | 2008 | 2007 | 2006 | 2005 |
|---|---|---|---|---|---|
| ආදායම (Total Revenue) | 913.27 | 1183.0 | 1388.47 | 772.27 | 817.10 |
| දළ ලාභය/(පාඩුව) [Gross Profit/ (Loss)] | 143.18 | 137.28 | 246.40 | 129.99 | 121.38 |
| මෙහෙයුම් ලාභය (Profit From Operations) | 2.02 | (18.28) | 95.21 | 4.23 | 23.46 |
| ශුද්ධ ලාභය/(පාඩුව) [Net Profit (Loss)] | (4.73) | (29.40) | 94.46 | 3.63 | 10.69 |




සමාලෝචනය කරමින් පවතින වර්ෂය ආර්මභ වූයේ ගෝලීය ආර්ථික පසුබැස්ම එහි උච්ච අවස්ථාවට ළඟා වී ඇති සහ නිෂ්පාදිත නිම් තේ වල මිළ අවුරුදු 3 ක මිළ පහත වැටීමකට ළඟා වී ඇති අවස්ථාවකය. ඉතා දුර්වල භාණ්ඩ මිළ තේ සහ පොහොර විකිණුම කෙරෙහි තදින් බලපානු ලබන ඉතා දැඩි වියළි කාලගුණ තත්ත්වයන් විසින් වඩ වඩා සංකීර්ණ තත්ත්වයකට පත් කර ඇත. 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ඉතා අසාමාන්‍ය වූ තේ කර්මාන්තයේ වැටුප් 42% කින් වැඩි වීම පවත්නා තත්ත්වය තවත් බරපතල අතට හරවා ඇත. තේ ශක්ති නිම් තේ නිෂ්පාදනය සහ එහි නිෂ්පාදන පිරිවැය පිළිබඳව වර්ෂ අතර කරන ලද සංසන්දනයක දී නිම් තේ නිෂ්පාදනය 30% කින් පහළ වැටී ඇති බවත් නිෂ්පාදන පිරිවැය 16% කින් ඉහළ ගොස් ඇති බවත් අනාවරණය විය. තවද මෙම අයහපත් දර්ශකයන් 29% ක් වූ ශුද්ධ විකුණුම් සාමාන්‍යයේ වැඩිවීම පූර්ණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවීය.

දේශීය තේ විකුණුම් ද සමාන අඩුවීම් රටාවක් ප්‍රදර්ශනය කරන ලද අතර, අලෙවිකරණ යාන්ත්‍රණයේ ඇති අඩුපාඩු මීට සාධක වී ඇත. තවද කලු තේ වෙළඳපොලේ 2009 වර්ෂයේ දී ඇති වූ පිරිහීමෙහි වක්‍ර විපාක ලද්දෙක් බවට තේ ශක්ති අරමුදල ද පත් වූ අතර, මෙයට මූලික හේතුව වූයේ අරමුදල සතු ක්‍රියාකාරී කර්මාන්තශාලා 12 කින් කර්මාන්තශාලා 9 ක්ම නිපදවූයේ පහතරට කලු තේ නිසා වූ බැවිනි. එසේම භාණ්ඩ මිළ පහත බසින කාලයක් හීදි ප්‍රථමයෙන් හානියට පත් වනුයේ සහ අවසනායට යථාතත්වයට පත් වනුයේ විශේෂිත භාණ්ඩවල මිළය.

## තේ ශක්ති අරමුදල

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2009

තේ ශක්ති අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව 2009 වර්ෂයේ දී මෙම අරමුදල වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරන ලදී. අරමුදලේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම විගණන හා කළමනාකරණ කමිටුව වර්ෂය තුළදී කිහිපවතාවක් මුණගැසින.

කමිටුව විසින් විගණන අංශයේ තත්ත්වයන් ඉහල නැංවීම සඳහා වැදගත් යෝජනා කිහිපයක් නිර්දේශ කර ක්‍රියාත්මක කර ඇත. අරමුදලේ සියළු කටයුතු විනිවිදභාවයකින් යුතුව සහ ඉතා උසස් අන්දමින් කරගෙන යාම සඳහා නවක යෝජනා ඉදිරිපත් කිරීමටත් නිර්දේශ කිරීමටත් සහ ක්‍රියාත්මක කිරීමටත් මෙම කමිටුවට අවස්ථාව සැලසී තිබිණ.මෙම කමිටුවේ මූලික අවධානය පහත ක්ෂේත්‍ර හා ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට යොමු වූයේ ය.

තේ කර්මාන්ත ශාලා
දේශීය තේ විකිණුම්
පොහොර ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකීය මහජනතාව සඳහා උපරිම ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් උපරිම සේවයක් ඉටුකිරීම සඳහා මෙම අංශයන් වැඩි දියුණු කළ හැකිය.

අරමුදලේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ ස්ථාපනය කරන ලද අභ්‍යන්තර විගණක ඒකකය හරහා වැදගත් අභ්‍යන්තර පාලන ක්‍රියමාර්ග කීපයක් විශේෂයෙන් තේ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ අවදානමක් සහිත කලාප වෙනුවෙන් ගැනීමට හැකිවිය.

පොහොර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ද විධිමත්ව සිදුකිරීමට කටයුතු කර ඇත.

විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අරමුදලේ පාලන හා මූල්‍ය කෙෂ්ත්‍ර තුළද නිසිලෙස යොදා ගන්නා ලද අතර මේ වන විට එම ක්ෂේත්‍ර වඩාත් හොඳ පාලනයක තිබේ.

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා කීපයකටද මෙම කමිටුව අප්‍රමාදව අවධානය යොමු කරන ලද අතර එවැනි යෝජනා ක්‍රියාත්මක කිරීමට සියළු උත්සාහ දරන ලදී.

මෙම වසර තුළදී ආයතනයේ අවසාන ගිණුම් අයවැය ඇස්තමේන්තු සහ තේ ශක්ති අරමුදලේ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර වැනි ආයතනික වශයෙන් ඉතාමත් වැදගත් තොරතුරු නිසිකලට ලබාදීමටද මෙම කමිටුව අනලස්ව කටයුතු කරන ලදී.

පී.අබේනායක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සම්බන්ධීකාරක - විගණක හා කළමනාකරණ කමිටුව

## තේ ශක්ති අරමුදල

## 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා

## ලාභ ලාභ ගිණුම

| | සටහන | මෙම වර්ෂය (රු) | පසුගිය වර්ෂය (රු) |
|---|---|---|---|
| ආදායම | 1 | **913,266,846.30** | 1,183,002,981.22 |
| විකිණුම් පිරිවැය | 2 | **(770,091,531.69)** | (1,045,726,709.38) |
| දළ මෙහෙයුම් ලාභය | | **143,175,314.61** | **137,276,271.84** |
| ධඅනෙකුත් ආදායම් | 3 | **34,193,796.11** | 17,996,555.30 |
| මුළු ආදායම | | **177,369,110.72** | **155,272,827.14** |
| මුළු ආදායම | 4 | **(155,675,669.50)** | (143,954,397.62) |
| බෙදාහැරීමේ වියදම් | 5 | **(19,672,776.33)** | (29,597,331.82) |
| | | **(175,348,445.83)** | **(173,551,729.44)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ලාභය/(අලාභය) | | **2,020,664.89** | **(18,278,902.30)** |
| මූල්‍ය පිරිවැය | 6 | **(6,751,367.52)** | (11,125,941.51) |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | 1-ආ | **(4,730,702.63)** | **(29,404,843.81)** |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | 7 | **24,224,780.92** | **53,629,624.73** |
| විසර්ජනයට පෙර ලාභය | | **19,494,078.29** | **24,224,780.92** |
| ලාභාංශ | | | |
| ඉදිරියට ගෙන ගිය ලාභය/(පාඩුව) | | **19,494,078.29** | **24,224,780.92** |

*** මෙහි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් අත්‍යාවශ්‍යයෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශනයේ සංඝටනීය කොටසක් වේ.

## තේ ශක්ති අරමුදල

## 2009 දෙසැම්බර් මස 31 දිනට ශේෂපත්‍රය

| | සටහන | මෙම වර්ෂය (රු) | පසුගිය වර්ෂය (රු) (රු) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල.යන්ත්‍රාගාර සහ උපකරණ | | | 487,519,214.67 |
| **හරැ පදකා සින්නක්කර** | | **408,802,657.52** | |
| **බිරැ පදකා කල්බදු** | | **48,690,269.16** | |
| | **8** | **457,492,926.68** | |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | **9** | **21,743,139.42** | 21,743,139.42 |
| | | **479,236,066.10** | **509,262,354.09** |
| **නොමේරූ බෝග** | | | |
| තේ වගාව | **10** | **2,600,466.40** | 2,337,880.58 |
| අනෙකුත් වගාවන් | **10** | **27,883.36** | 9,367.00 |
| | | **2,628,349.76** | **2,347,247.58** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ සහ තොග | **11** | **196,521,757.40** | 202,132,527.38 |
| ණයහිමියන් සහ අනෙකුත් ලැබියයුතු දෑ | **12** | **208,781,289.51** | 168,848,661.20 |
| අත්තිකාරම් පෙර ගෙවුම් සහ තැම්පතු | **13** | **37,111,284.31** | 68,006,078.17 |
| කෙටිකාලීන ආයෝජන | **14** | **123,297,107.13** | 230,622,385.05 |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | **15** | **88,317,322.29** | (7,470,405.59) |
| අන්තර් ජංගම ගිණුම් | **16** | **15,071,218.01** | 14,260,427.73 |
| | | **669,099,978.65** | **676,399,673.94** |
| මුළු වත්කම් | | **1,150,964,394.51** | **1,188,009,275.61** |

| | | | |
|---|---|---|---|
| සම කොටස් සහ හිමිකම් | | | |
| කොටස් ප්‍රාග්ධනය | **17** | **208,959,130.00** | 208,959,130.00 |
| ටී. එස්. එච්. ඩී. එග් (රාජ්‍ය) ආධාර | **18** | **437,505,030.22** | 437,505,030.22 |
| ප්‍රත්‍යගණන අතිරික්තය | | **13,870,173.86** | 13,870,173.86 |
| රඳවාගත් ඉපැයුම් /(පාඩු) | | **19,494,078.29** | 24,224,780.92 |
| සම කොටස් වල එකතුව | | **679,828,412.37** | **684,559,115.00** |
| **සාමාජිකයන්ගේ යහසාධක අරමුදල** | | | |
| සාමාජික දායක මුදල් | **19** | **134,352,375.58** | 133,853,375.58 |
| **ජංගම නොවන හිමිකම්** | | | |
| ටී. එස්. එච්. ඩී. ඒ | **20** | **74,048,541.30** | 74,048,541.30 |
| **ජංගම හිමිකම්** | | | |
| ණයහිමියෝ සහ ගෙවිය යුතු දෑ | **21** | **197,594,127.09** | 198,318,240.16 |
| බැංකු ණය | | | 48,809,520.00 |
| උපචිත වියදම් | **22** | **65,140,938.17** | 48,420,483.57 |
| | | **262,735,065.26** | **295,548,243.73** |
| **මුළු සමකොටස් සහ හිමිකම් වල එකතුව** | | **1,150,964,394.51** | **1,188,009,275.61** |

මෙහි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් අත්‍යාවශ්‍යයෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශනයේ සංඝටනීය කොටසක් වේ.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| නොඑල් පද්මසිරි කාරියවසම් | දයා අව්රුප්පල | පී.පී.ආර්.තිස්ස |
| සභාපති | ප්‍රධාන විධායක නිලධාරී | ප්‍රධාන ගණකාධිකාරී |
| තේ ශක්ති අරමුදල | තේ ශක්ති අරමුදල | තේ ශක්ති අරමුදල |

## තේ ශක්ති අරමුදල
## 2009 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශණය

| | | |
|---|---|---|
| බදු පෙර මෙහෙයුම් ලාභ | | **(4,730,702.63)** |
| ගැලපුම් | | |
| ක්ෂය වීම් | 31,807,906.50 | |
| පාරිතෝෂික සදහා වෙන්කිරීම් | 8,384,915.77 | |
| පොලිය මත ආදායම | (12,619,637.41) | |
| පොලී වියදම් | 1,398,336.52 | 28,971,521.38 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **24,240,818.75** |
| තොග සහ නිමි භාණ්ඩ (වැඩි වීම්)/අඩුවීම් | 5,610,769.90 | |
| නොනිමි භාණ්ඩ (වැඩි වීම්)/අඩුවීම් | (281,102.18) | |
| ණය කරුවෝ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම්)/අඩුවීම් | (39,932,628.30) | |
| දේශීය තේ විකිණුම් සඳහා තේ තොග | | | | | 392,679.62 | **392,679.62** |
| පොහොර | | | | | | **-** |
| දළු මලු - කොහු | | | | | | **-** |
| කර්මාන්තශාලා තේ තොගය | | 150,597,689.13 | | | | **150,597,689.13** |
| ලිපිද්‍රව්‍ය තොගය | 276,209.84 | | | | | **276,209.84** |
| ඩොලමයිට් තොග | | | 148,880.30 | | | **148,880.30** |
| එප්පාවල රොක් පොස්පේට් තොග | | | 1,303,728.67 | | | **1,303,728.67** |
| කීසරයිට් තොග | | | 1,615,325.97 | | | **1,615,325.97** |
| මියුරියෙට් ඔෆ් පොටෑශ් තොග | | | 1,145,329.04 | | | **1,145,329.04** |
| සල්ෆේට් ඔෆ් ඇමෝනියා | | | 9,392,598.97 | | | **9,392,598.97** |
| යූරියා තොග | | | 17,683,225.25 | | | **17,683,225.25** |
| ඩබ්. පී. පී. ඔලගු | | | 3,705,009.57 | | | **3,705,009.57** |
| අනියම් තොග | | | | | | **-** |
| **නිමි භාණ්ඩ** | | | | | 510,027.50 | **510,027.50** |
| එස්. ටී. උඩරට මැද | | | 91,784.97 | | | **91,784.97** |
| එසී. ටී. ඌව | | | 19,420.11 | | | **19,420.11** |
| එස්.ටී.පහතරට | | | 14,589.38 | | | **14,589.38** |

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලාව | පොහොර | සුභසාධන | දේශීය තේ විකිණුම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| T 200 පොහොර | | | 1,660,425.52 | | | **1,660,425.52** |
| T 750 පොහොර | | | 2,512,154.79 | | | **2,512,154.79** |
| U 625 පොහොර | | | 715,872.54 | | | **715,872.54** |
| U 709 පොහොර | | | 128,199.99 | | | **128,199.99** |
| වී. පී. පහතරට | | | 522,539.61 | | | **522,539.61** |
| ටී. පී. උඩරට මධ්‍යම | | | 831,925.58 | | | **831,925.58** |
| වී. පී. ඌව | | | 1,035,578.32 | | | **1,035,578.32** |
| වනවගාව | | | 2,242.63 | | | **2,242.63** |
| වයි. පී. එම්. ඩබ්. පොහොර | | | 91.78 | | | **91.78** |
| ඒ.පී.එම්. පොහොර | | | 201.68 | | | **201.68** |
| කුරුඳු - එස්. ඒ. | | | 785,267.16 | | | **785,267.16** |
| කුරුඳු - යූ. ආර්. ටී. ඒ. | | | 142,240.39 | | | **142,240.39** |
| භාණ්ඩ වර්ටෝරුව | 17,217.20 | | 100,375.86 | | | **117,593.06** |
| සැපයුම් භාණ්ඩ වර්ටෝරුව | | | 183,075.38 | | | **183,075.38** |
| විශාල තොග | | | | | | **-** |
| බැහැර කළ හැකි වත්කම් | | | 16,318.02 | | | **16,318.02** |
| පොලිතින් තොගය | | | | | 971,532.63 | **971,532.63** |
| මුළු එකතුව | **293,427.04** | **150,597,689.13** | **43,756,401.48** | **-** | **1,874,239.75** | **196,521,757.40** |

වාර්ෂික වාර්තාව 2009
ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

<u>ලැයිස්තු අංකය :- 12</u> <u>ණය ගැතියෝ සහ ලැබිය යුතු දෑ</u>

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්තශාලා | පොහොර | දේශීය විකිණුම් | සුභසාධන | තේ අපනයන | එම්/ කර්මාන්තශාලා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ලැබිය යුතු ගිණුම | | 91,568,116.81 | 94,484,467.90 | 7,467,933.60 | | 19,903,064.75 | 21,041,545.32 | **234,465,128.38** |
| සහනාධාර ලැබිය යුතු | | | | | | | | **-** |
| තුරුසවිය | | | | | 20,103.14 | | | **20,103.14** |
| ලැබිය යුතු ගිණුම - ට්‍රැක්ටර් | 920,071.00 | | | | | | | **920,071.00** |
| තේ කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | 768,920.00 | | | | | | | **768,920.00** |
| රන් දළු මේලා අරමුදල | 384,700.00 | | | | | | | **384,700.00** |
| කුඩා තේ වතු හිමියන්ගේ අරමුදල | 118,130.12 | | | | 50,068.75 | | | **168,198.87** |
| ටී. එස්. එච්. ඩී. ඒ. | 80,000.00 | | | | | | | **80,000.00** |
| කොටස් එකතුව | | | | | 19,300.00 | | | **19,300.00** |
| පොලිය ලැබිය යුතු | | | | 101,663.01 | 9,761,851.00 | | | **9,863,514.01** |
| ණය ටී. එස්. ඒ. ඩී. ඒ. බණ්ඩාරවෙල | | | 68,899.74 | | | | | **68,899.74** |
| ණය ටී. එස්. ඒ. ඩී. ඒ. නුවර | | | 304,164.00 | | | | | **304,164.00** |
| රැඳවුම් බද්ද පොහොර ලැබීම් | 1,092,581.96 | | | | | | | **1,092,581.96** |
| කර්මාන්තශාලාවෙන් ලැබිය යුතු දෑ | | | | | | | | **-** |
| පොහොර වලින් ලැබිය යුතු දෑ | | | | | | | | **-** |

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්තශාලා | පොහොර | දේශීය විකිණුම් | සුහසාධන | තේ අපනයන | එම්/ කර්මාන්තශාලා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ටී. එස්. එෆ්. ප්‍රධාන කාර්යාලයෙන් ලැබිය යුතු දෑ | | | 50,000.00 | | | | | **50,000.00** |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 236,000.00 | | | | | | | **236,000.00** |
| අරමුදල පොලිය - දේශීය තේ විකිණුම් | | | 400,000.00 | | | | | **400,000.00** |
| අරමුදල පොලිය - පොහොර | | | 400,000.00 | | | | | **400,000.00** |
| රක්ෂණ විලම්බන | | | | | 451,874.52 | | | **451,874.52** |
| ණය ගැතියෝ - රයිගම් | | | | 571,107.42 | | | | **571,107.42** |
| ලාභාංශ ගිණුම | 208,129.90 | | | | | | | **208,129.90** |
| එකතුව | **3,808,532.98** | **91,568,116.81** | **95,707,531.64** | **8,140,704.03** | **10,303,197.41** | **19,903,064.75** | **21,041,545.32** | **250,472,692.94** |
| අඩුකරන්න (-) | | | | | | | | |
| බොල් ණය සඳහා වෙන් කිරීම. | | | | (746,793.36) | | | | **(746,793.36)** |
| 2006 10% බොල් ණය | | | | | | | | **0.00** |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | | | | | | | | **0.00** |
| 2007 10% බොල් ණය | | | | 630,061.08 | | | | **630,061.08** |
| 2008 - බොල් ණය සඳහා වැඩිපුර වෙන් කිරීම් | | | | **116,732.28** | | | | **116,732.28** |
| | | | | | | | | **0.00** |
| බොල් ණය සඳහා වෙන් කිරීම. | | | | | | (19,903,064.75) | (21,041,545.32) | **(40,944,610.07)** |
| 2009 10% බොල් ණය | | | | **(746,793.36)** | | | | **(746,793.36)** |
| මුළු එකතුව | **3,808,532.98** | **91,568,116.81** | **95,707,531.64** | **7,393,910.67** | **10,303,197.41** | **0.00** | **0.00** | **208,781,289.51** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ලැයිස්තු අංකය:- 13 අත්තිකාරම්, පෙර ගෙවුම් සහ තැන්පතු

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | දේශීය තේ විකිණුම් | එකතුව |
|---|---|---|---|---|
| අත්තිකාරම් | | 35,097,529.75 | | **35,097,529.75** |
| කර්මාන්ත ශාලා අත්තිකාරම් | | | | **-** |
| බී. සී. ඇග්රෝටොනික්ස් | | | | **-** |
| ජිනසේන ඉංජිනේරු ටෙක්නොලොජිස් | | | | **-** |
| සාමාන්‍ය ඉංජිනේරු සේවා | | | | **-** |
| ජංගම දුරකථන ණය | | | | **-** |
| වෝටර්මන් කනස්ට්‍රක්ෂන් | | | | **-** |
| උත්සව අත්තිකාරම් | 167,200.00 | | 666,254.56 | **833,454.56** |
| දීපවාලී අත්තිකාරම් | | | | **-** |
| විශේෂ අත්තිකාරම් | 132,300.00 | | | **132,300.00** |
| වැටුප් අත්තිකාරම් | 10,000.00 | | | **10,000.00** |
| රෙදිපිළි සඳහා කාර්යමණ්ඩල ණය | | | | **-** |

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | දේශීය තේ විකිණුම් | එකතුව |
|---|---|---|---|---|
| | | | | |
| පෙර ගෙවුම් | | | | - |
| වෙනත් තැන්පතු | 226,000.00 | | | **226,000.00** |
| වාහන සඳහා තැන්පතු | | | | - |
| කුලී සඳහා තැන්පතු | 692,000.00 | | 120,000.00 | **812,000.00** |
| ලංකා විදුලි බල මණ්ඩලය | | | | - |
| එකතුව | **1,227,500.00** | **35,097,529.75** | **786,254.56** | **37,111,284.31** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ලැයිස්තු අංකය:- **14** ආයෝජන

| විස්තරය | කර්මාන්ත ශාලා | පොහොර | දේශීය තේ විකිණුම් | සුබසාධක | එකතුව |
|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | 28,839,259.13 | 32,500,000.00 | | 3,000,000.00 | **64,339,259.13** |
| දින 7 ඇමතුම් තැන්පතු | | | | | **-** |
| ණයවර ලිපි සඳහා තැන්පතු | | | | | **-** |
| ස්ථිර තැන්පතු | | 45,657,848.00 | 400,000.00 | 12,900,000.00 | **58,957,848.00** |
| මුළු එකතුව | **28,839,259.13** | **78,157,848.00** | **400,000.00** | **15,900,000.00** | **123,297,107.13** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

## ලැයිස්තු අංකය:- 15 මුදල් හා බැංකු ශේෂය

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්තශාලා | පොහොර | දේශීය තේ විකිණුම් | අපනයන | සුබ සාධක | කර්මාන්ත ශාලා කළමණාකරනය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ගිණුම් අංක: 2937124 | (2,819,650.11) | | | | | | | **(2,819,650.11)** |
| ගිණුම් අංක: 2937158 | | | | | (1,112,680.89) | | | **(1,112,680.89)** |
| ගිණුම් අංක: 2937157 | | | 20,500,457.68 | | | | | **20,500,457.68** |
| ගිණුම් අංක: 2937161 | | 64,213,165.82 | | | | | | **64,213,165.82** |
| ගිණුම් අංක: 2937165 | | | | | | | | **-** |
| අතැති මුදල් | | | | | | | | **-** |
| බැංකුවේ ඇති මුදල් | | | | | | | | **-** |
| බැංකුවේ ඇති මුදල්-පොහොර | | | | | | | | **-** |
| ගිණුම් අංක: 2937164 | | | | (815,657.61) | | | | **(815,657.61)** |
| ගිණුම් අංක: 2937023 | | | | | | (9,700,079.37) | | **(9,700,079.37)** |
| ගිණුම් අංක: 2937162 | | | | | | 17,052,368.29 | | **17,052,368.29** |
| ගිණුම් අංක: 2937163 | | | | | | 73,534.00 | | **73,534.00** |
| ගිණුම් අංක: 2937155 | | | | | | | 866,900.05 | **866,900.05** |
| ගිණුම් අංක: 2937158 | | | | | | | 8,964.43 | **8,964.43** |
| සුළු මුදල් | | | 50,000.00 | | | | | **50,000.00** |
| මුළු එකතුව | **(2,819,650.11)** | **64,213,165.82** | **20,550,457.68** | **(815,657.61)** | **(1,112,680.89)** | **7,425,822.92** | **875,864.48** | **88,317,322.29** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

<u>ලැයිස්තු අංකය:- **16**</u> <u>අභ්‍යන්තර ජංගම ගිණුම</u>

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | පොහොර | දේශීය තේ විකිණුම් | සුබ සාධක | කර්මාන්ත ශාලා කළමණාකරනය | අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | (114,136,961.36) | | 114,136,961.34 | (21,503,330.48) | 22,535,170.16 | (4,293,186.02) | (2,654,912.01) | **(5,916,258.37)** |
| කර්මාන්ත ශාලා | 64,435,113.95 | (64,435,113.95) | 23,241,818.01 | (1,553,940.00) | | (9,356,350.18) | | **12,331,527.83** |
| පොහොර | | (23,241,818.01) | | 100,000.00 | 19,166,684.93 | | (250,000.00) | **(4,225,133.08)** |
| දේශීය තේ විකිණුම් | 21,306,389.09 | 2,435,160.00 | 358,400.00 | | 1,000,000.00 | | (17,847,133.87) | **7,252,815.22** |
| සුබ සාධක | (22,640,170.12) | | (19,166,684.93) | | | | (472,056.00) | **(42,278,911.05)** |
| කර්මාන්ත ශාලා කළමණාකරනය | 4,293,186.02 | 9,358,350.18 | 190,000.00 | | | | | **13,841,536.20** |
| අපනයන | 2,654,912.01 | 389,499.00 | 250,000.00 | 17,847,133.87 | 472,056.02 | | | **21,613,600.90** |
| උප එකතුව | **(44,087,530.41)** | **(75,493,922.78)** | **119,010,494.42** | **(5,110,136.61)** | **43,173,911.11** | **(13,649,536.20)** | **(21,224,101.88)** | **2,619,177.65** |
| අන්තර් කර්මාන්ත ශාලා ගිණුම් ශේෂය | | | | | | | | **12,452,040.36** |
| මුළු එකතුව | | | | | | | | **15,071,218.01** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

**ලැයිස්තු අංකය :- 17 කොටස් ප්‍රාග්ධනය**

| | |
|---|---|
| අනුමත කොටස් ප්‍රාග්ධනය | 500,000,000.00 |

**සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් (වර්ණීය නොවන)**

| | |
|---|---|
| වර්ෂ ආරම්භයේ ශේෂය | 197,984,666.00 |
| අවුරුද්ද තුල ලැබීම් (සසඳන ලද) | 10,974,464.00 |
| වර්ෂ අවසානයේ ශේෂය | **208,959,130.00** |

**ලැයිස්තු අංකය:- 18 ටී. එස්. එච්. ඩී. ඒ (රාජ්‍ය) ආධාර මුදල්**

| | |
|---|---|
| 1998 වර්ෂය තුල ලද ආධාර මුදල් | 26,690,873.44 |
| 1999 වර්ෂය තුල ලද ආධාර මුදල් | 127,540,786.45 |
| 2000 වර්ෂය තුල ලද ආධාර මුදල් | 69,540,270.33 |
| 2001 වර්ෂය තුල ලද ආධාර මුදල් | 185,000,000.00 |
| 2002 වර්ෂය තුල ලද ආධාර මුදල් | 23,500,000.00 |
| 2004 වර්ෂය තුල ලද ආධාර මුදල් | 5,233,100.00 |
| මුළු එකතුව | **437,505,030.22** |

**ලැයිස්තු අංකය:- 19 සාමාජික දායක මුදල්**

| | |
|---|---|
| 2007/01/01 දිනට ශේෂය | 133,246,701.57 |
| 2007 වර්ෂයේ එකතු කිරීම් | 219,191.01 |
| 2008 වර්ෂයේ එකතු කිරීම් | 387,483.00 |
| 2009 වර්ෂයේ එකතු කිරීම් | 499,000.00 |
| **2005/12/31** දිනට අවසන් ශේෂය | **134,352,375.58** |

## ලැයිස්තු අංකය :- 20 ටී. එස්. එච්. ඩී. ඒ

| | |
|---|---|
| කර්මාන්තශාලා | 58,001,047.37 |
| ප්‍රධාන කාර්යාලය- තේ ශක්ති අරමුදල | 2,151,761.41 |
| දේශීය තේ විකිණුම් | 4,206,269.39 |
| සුබසාධන | 9,689,463.13 |
| මුලු එකතුව | **74,048,541.30** |

## ගිණුම් සඳහා සටහන්
## දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

**ලැයිස්තු අංකය :- 21** ණය හිමියෝ සහ ගෙවිය යුතු දෑ

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | පොහොර | දේශීය තේ විකිණුම් | සුබ සාධක | කර්මාන්ත ශාලා කළමණාකරනය | අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ගෙවිය යුතු දෑ | | 109,453,988.06 | 2,747,800.00 | 2,301,150.00 | | 7,166,014.80 | | **121,668,952.86** |
| සී/ඒ කලුතර ආර්/ඕ | 189,147.00 | | | | | | | **189,147.00** |
| සී/ඒ කෑගල්ල | 102,932.40 | | | | | | | **102,932.40** |
| සී/ඒ මාතර | 240,134.48 | | | | | | | **240,134.48** |
| සී/ඒ රත්නපුර | 249,040.94 | | | | | | | **249,040.94** |
| සී/ඒ වලහන්දූව | | | | | | | | **-** |
| ණය හිමියෝ | 40,000.00 | | | | | | | **40,000.00** |
| උ.වි.ගෙ.බදු ගෙවිය යුතු | 99,307.80 | | | 7,817,147.26 | | | | **7,916,455.06** |
| අනියම් වැටුප් ගෙවිය යුතු | 10,478.80 | | | | | | | **10,478.80** |
| මුද්දර ගාස්තු | 6,603.06 | | 1,601.00 | 152.00 | | | | **8,356.06** |
| ටී.එස්.ඩබ්.එස්. ණය ගෙවිය යුතු | 50,000.00 | | | | | | | **50,000.00** |
| වෛද්‍ය අරමුදල | 36,743.22 | | | | | | | **36,743.22** |
| සුබසාධක සහනාධාර | 25,000.00 | | | | | | | **25,000.00** |
| පොහොර ආනයනය සඳහා ගෙවිය යුතු | | | 28,642,399.00 | | | | | **28,642,399.00** |
| ආපසු දෙන ප්‍රසම්පාදන/අනෙකුත් තැන්පතු | 37,870.00 | | 120,000.00 | | | | | **157,870.00** |
| ආපසු දෙන නියෝජිත ගාස්තු | | | 50,000.00 | 30,609.00 | | | | **80,609.00** |
| රැඳවුම් බදු ගෙවිය යුත | 15,791.88 | | 398,392.25 | | | | | **414,184.13** |
| අත්හිටවූ බදු ගෙවිය යුතු කොට්ඨාශ | 2,060,709.05 | | | | | | | **2,060,709.05** |
| අත්හිටව බදු ගෙවිය යුතු ප්‍රධාන කාර්යාලය | | | 1,076,378.61 | | | | | **1,076,378.61** |
| පාරිතෝෂික | 1,295,762.60 | | | | | | | **1,295,762.60** |

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | පොහොර | දේශීය තේ විකිණුම් | සුබ සාධක | කර්මාන්ත ශාලා කළමණාකරනය | අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| වෙන්කිරීම් | | | | | | | | |
| | | | | | | | | |
| ලාභාංශ වෙන්කිරීම් | | | | | | | 208,129.90 | **208,129.90** |
| සුභසාධන ගෙවිය යුතු | | | | | | | | |
| කොත්මලේ තේ ශක්ති අරමුදල | | | | 1,723,570.80 | | | | **1,723,570.80** |
| ලංකා බැංකු ණය | | | | | | | | **-** |
| රක්ෂණ විලම්භනය | | 20,373,515.17 | 9,403,160.85 | 1,567,193.48 | | | | **-** |
| 2007 ලාභාංශ/දිරි දීමනා වෙන්කිරීම් | **4,459,521.23** | **129,827,503.23** | **42,439,731.71** | **13,439,822.54** | **0.00** | **7,166,014.80** | **208,129.90** | **31,343,869.50** |

ගිණුම් සඳහා සටහන්
දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

**ලැයිස්තු අංකය:- 22** **උපචිත වියදම් හා ප්‍රතිපාදන**

| විස්තරය | ප්‍රධාන කාර්යාලය | කර්මාන්ත ශාලා | පොහොර | දේශීය විකිණුම් | සුබසාධක | කර්මාන්ත ශාලා කළමණාකරනය | තේ අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| උපචිත වියදම් | 51,573.49 | 64,932,006.94 | 128,857.74 | 28,500.00 | - | - | - | **65,140,938.17** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / My Nomber / எனது இல - පීඑයි/ඒ/ටීඑස්එෆ්/එෆ්පී/2009

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date - 2011 මැයි 31 දින

සභාපති

තේ ශක්ති අරමුදල

**තේ ශක්ති අරමුදලේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

තේ ශක්ති අරමුදලේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ 13 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2010 ඔක්තොබර් 27 දින අරමුදලේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් , යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, තේ ශක්ති අරමුදල 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙය දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 දෙසැම්බර් 31 දිනට රු.19,268,059 ක් වූ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව වෙනම ආයෝජනය කර නොතිබුණි.

(ආ) දේපල පිරියත හා උපකරණ අයිතමයන් සඳහා ස්කන්ධය තුල ඇතුලත්වී ඇති ප්‍රත්‍යාගනන අතිරික්තය එම වත්කම් ඉවත් කිරීමේදී මුළු අතිරික්තය හෝ වත්කම භාවිතා කිරීමේදී වත්කමෙහි ප්‍රත්‍යාගණිත ධාරන අගය මත පදනම් වූ ක්ෂය හා වත්කමෙහි මුළු පිරිවැය මත පදනම් වූ ක්ෂය අතර වෙනස රඳවා ගත් ඉපයීම් වලට මාරු කල යුතු ලෙස ගිණුම්කරණ ප්‍රමිත 18 හි සඳහන් වුවත් අරමුදල සහ දේපල පිරියත හා උපකරණවලට අදාල රු.13,870,174 ක් වූ ප්‍රත්‍යාගනන අතිරික්තය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 30 ක කාල පරිච්ඡේදයක් සඳහා මෙහෙයුම් කල්බදු යටතේ ලබා ගන්නා ලද පත්සලතැන්න, කොත්මලේ කම්හල් හා ඊට අදාල ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ට අනුව කල්බදු කුලී ලෙස වාර්ෂිකව ලාභයට ලියා හරිනු වෙනුවට රු.62,872,351 කට ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලෙසද, රු.5,255,295 ක් ක්ෂයවීම් ලෙසද , ගිණුම් වල දක්වා තිබුණි.

### 2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 හා පෙර වර්ෂ වලදී ප්‍රාග්ධන දායකය ලෙස රජයෙන් ලැබී තිබුණු රු.437,505,030 ක රජයේ ප්‍රදාන ප්‍රාග්ධන හෝ පුණරාවර්තන වශයෙන් විධිමත්ව හඳුනා නොගෙන මුළු ස්කන්ධ ප්‍රාග්ධනයේ කොටසක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු. 102,765,390 ක් වූ මුදල් හා බැංකු ශේෂ හා වටිනාකම රු.14,448,068 ක් වූ බැංකු අයිරා මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්නුම් නොකර රු. 88,317,322 ක වාසිදායක ශේෂයක් ලෙස එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වෙතත් ඉහත ශේෂයේ ඇතුලත් රු. 9,700,079 ක් වූ බැංකු අයිරාව සඳහා වූ බැංකු සැසඳුම් හා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ලැබී නොතිබුණි.

(ඇ) අත්තිකාරම් වශයෙන් දෙනු ලබන මුදල් අත්තිකාරම් ලබා දුන් අවස්ථාවේදීම වියදමක් ලෙස ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම හේතුවෙන් 2009 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.485,184 ක නොපියවූ අත්තිකාරම් ලාභයට එරෙහිව වියදමක් සේ සලකා ගිණුම් වලින් කපා හැර තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදල සතු වටිනාකම රු.58,957,848 ක් වූ ස්ථාවර තැන්පතු (ස්වයංක්‍රියව අලුත් වන ) සඳහා 2009 වර්ෂයට අදාළ ලැබිය යුතු පොලී ආදායම ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) වර්ෂ කිපයක සිට දේශීය හා අලෙවි අංශයේ ආයෝජන වෙනුවෙන් ලැබිය යුතු පොලිය වූ රු.101,663 ක ශේෂය හඳුනාගෙන ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(ඊ) 1999 වර්ෂයේදී රු.375,000 ක වාර්ෂික බදුකුලී ගෙවීමේ පදනම මත වසර 30ක කාලයකට බදු ගන්නා ලද පන්සල්තැන්න වත්ත හා කම්හල වෙනුවෙන් ගෙවන ලද රු.4,000,000ක අත්තිකාරම් මුදල වාර්ෂිකව බදු කාලයතුළදී කපා හැරීම වෙනුවට රු.3,441,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව ලියා හැර තිබුණි.

(උ) 2004 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුනු කොත්මලේ කම්හලේ රු.1,053,680ක බදු කුලී අත්තිකාරම් බදු කාලපරිච්ඡේද අනුව ලාභයට ලියා හැරීම 2009 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඌ) බැංකු වාර්තා සමඟ සසඳා ගිණුම් වල ගැලපීම් නොකිරීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ගිණුම් හා පොලී ආදායම් ගිණුම් වල රු.8,562,568 ක පොලිය අඩුවෙන් ගිණුම්ගතවීමක් නිරීක්ෂණය විය.

2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමක හා සුහසායන අංශයේ බැංකු ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ වල දැක්වෙන නොසැසඳුනු රු.165,810 ක බැර හා රු.1,067,955 ක හර ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවතුන අතර එම ශේෂ හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය, සුහසාධන අංශය හා පොහොර අංශයන්ට අදාල බැංකු ගිණුම් 03 ක ශේෂ , මුදල් පොතේ සඳහන් බැංකු ශේෂ සමඟ සැසඳීමේදී රු.16,271,449 ක හර ශේෂ වෙනසක් හා රු.1,143,790 ක බැර ශේෂ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු වල වටිනාකම රු.123,297,107ක් වුවත් ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව එය රු.116,855,590ක් වුයෙන් නොසැසඳුණු වෙනස රු. 6,441,517 ක් විය.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ ගිණුම් හා කම්හල් ගිණුම් අතර ලැබීම් හා ගෙවීම් තියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විස්තරය | ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අනුව ශේෂ | කම්හල් ගිණුම් අනුව ශේෂ | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| රඳවා ගැනීමේ බදු | 1,092,582 | 1,076,379 | 16,203 |
| දේශීය තේ විකුණුම් අංශයෙන් කොත්මලේ කම්හලට ගෙවිය යුතු මුදල් | 1,723,571 | - | 1,723,571 |
| දේශීය තේ විකුණුම් අංශයෙන් පත්සල්තැන්න කම්හලට ලැබිය යුතු මුදල | - | 58,795 | 58,795 |
| ණය ගැති ගිණුම - පොහොර අංශය | 38,209,154 | 30,491,826 | 7,717,328 |
| ලැබිය යුතු පොලී -සුහසාධන අංශය | 9,761,851 | 16,244,777 | 6,482,926 |

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී "රුසියානු ලංකා බද්ධ ගිවිසුම" යටතේ රුසියාවට අපනයනය කරන ලද තේ තොගයක් සඳහා ලැබිය යුතු වූ රු.මිලියන 19.9 ක් හා පෞද්ගලික තේ කර්මාන්ත ශාලා 14 කට ණය පදනම මත කරන ලද තේ විකුණුම් වලට අදාලව රු.මිලියන 21 ක් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල බොල් හා අඩමාණ ණය ලෙස ප්‍රතිපාදනයන් කර තිබුණි.

(ආ) කර්මාන්තශාලා ඉදිකිරීම සහ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා වර්ෂ 2001 සිට 2004 යන කාලපරිච්ඡේදය තුලදී පෞද්ගලික පාර්ශව 4 කට එකතුව රු.33,154,952 ක අත්තිකාරම් ලබා දී තිබුණද අදාල ඉදිකිරීම් කටයුතු නිමකර හෝ එම අත්තිකාරම් පියවා ගෙන හෝ නොතිබුණි.

(ඇ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් යටතේ දැක්වෙන පිළිවෙලින් රු.16,997,312ක් හා රු. 84,244,484 ක් වූ ශේෂ නිරවුල් කිරීමට විගණිත දිනය වූ 2010 ජූනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) කොළඹ තේ බ්‍රෝකර් සංගමයේ අංක 59/2007 දරණ චක්‍රලේඛයේ 28 හා 29 (අ) ඡේද ප්‍රකාර බ්‍රෝකර් වරුන්ට විකුණනු ලබන තේ වලින් දින 7 ක් ඇතුලත එම මුදල ලබා ගත යුතු වුවද 2006 හා 2007 වර්ෂ සඳහා තේ බ්‍රෝකර් සමාගමකින් ලැබිය යුතු රු.19,744,732 ක මුදල මේ දක්වා අයකර ගෙන නොතිබුණි. අදාල සමාගමට විරුද්ධව නඩු පවරා ඇති බව ආයතනයේ සභාපතිවරයා දන්වා තිබුණි.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

| | විෂයය | වටිනාකම රු. | ලබාගත නොහැකි වූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 509,787,137 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) | උපයන විට ගෙවීමේ බදු-දේශීය තේ විකුණුම් අංශය | 7,817,147 | විස්තරාත්මක උපලේඛන |
| (ඇ) | වර්ෂය සඳහා ක්ෂය | 17,625,823 | ගණනය කිරීම් වලට අදාල විස්තර |
| (ඈ) | සමුච්චිත ක්ෂය | 101,087,630 | |
| (ඉ) | පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන- ප්‍රධාන කාර්යාලය | 1,295,763 | උපලේඛන |
| | - කර්මාන්තශාලාව | 17,972,296 | |
| (එ) | කල්බදු පදනම මත ලබා ගත් ස්ථාවර වත්කම් - කොත්මලේ කම්හල | 29.653.398 | කල්බදු ගිවිසුම |

## 2:2:6 හඳුනා නොගත් ශේෂ

හඳුනා නොගත් අන්තර් ප්‍රාදේශීය ජංගම ගිණුම් ශේෂයන් එකිනෙක ගිණුම් අතර නිරවුල් නොකර වර්ෂය අවසානයේ ජංගම වත්කම් යටතේ රු.15,071,218 ක් දක්වා තිබුණි. මින් රු.12,845,902 ක් 2004 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේදී හඳුනා නොගත් අන්තර් ප්‍රාදේශීය ජංගම ගිණුම් අතර ශේෂය රු.810,790 ක් විය.

## 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | | රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | | රජයේ මුදල් රෙගුලාසි | |
| | (i) | මු.රෙ. 110 | පාඩු හා හානි සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) | මු.රෙ. 188 | බැංකු ගිණුම් දෙකක උපලබ්ධි නොවුනු එකතුව රු.1,013,688 ක් වූ තැන්පතු මාස 06 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි. |
| | (iii) | මු.රෙ. 383 | සමාලෝචිත වර්ෂය අවසානයට බැංකුව විසින් කර තිබුණු වටිනාකම රු.12,787,457 ක් වූ සෘජු බැරකිරීම් හඳුනාගෙන අදාල ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) | මු.රෙ. 396 | ප්‍රධාන කාර්යාලය, සුභසාධන, පොහොර හා කම්හල් යන අංශ වලට අදාල බැංකු ගිණුම්වල වටිනාකම රු.5,315,845 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (v) | මු.රෙ. 1645 සහ 1646 | 2009 වර්ෂය සඳහා වාහන 06ක දෛනික ධාවන සටහන් සමග ඊට අදාල මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු නමුත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 2003 ජුනි 02 දිනැතිඅංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6:5:1වගන්තිය | 2009 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2010 සැප්තැම්බර් 15 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | | 7.3 (ඇ) වගන්තිය | අරමුදල සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත් පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | සේවක වැටුප් සංශෝධන, බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටිය මෙම වාර්තාවේ දිනය වන විටත් කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව විසින් අනුමතකර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/90 | එක් එක් වාහනයේ ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් ස්වාධීන නිලධාරියකු විසින් පරීක්ෂාවට භාජනය කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, අරමුදලේ මෙහෙයුම් වලින් සමාලෝචිත වර්ෂය සඳහා සමස්ත මූල්‍ය ප්‍රතිඵලය රු.4,730,703 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.29,404,844 ක අලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.24,674,141 ක වර්ධනයක් දැක්වුණි. පෙර වර්ෂය හා සැසඳීමේදී රු.275,635,177 කින් විකුණුම් පිරිවැය පහළ යාමත්, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සහ මූල්‍ය පිරිවැය රු.14,299,133කින් පහළයාමත් හා අනෙකුත් ආදායම් රු.16,197,241කින් ඉහළ යාමත් මෙම වර්ධනයට හේතු වී තිබුණි.

#### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) කර්මාන්තශාලා අංශය

2009 වර්ෂය සඳහා වූ මූල්‍ය ආදායම 2008 වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 269.7කින් එනම් 22.8% කින් අඩු වී තිබුණු අතර කර්මාන්තශාලා විකුණුම් රු. මිලියන 252 කින් එනම් 24% කින් අඩු වී තිබුණි. අරමුදලේ කර්මාන්තශාලා ලාභය පෙර වර්ෂය හා සැසඳීමේදී රු.මිලියන 55.5 කින් එනම් 139.7 % කින් වැඩිවී තිබුණි.

(ආ) දේශීය තේ අලෙවි අංශය

දේශීය තේ අලෙවි අංශය 2001 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර අධීක්ෂණය දුර්වල වීම, නිසි පුහුණුව ලබා නොදීම වැනි හේතු නිසා එම අංශය 2006 වර්ෂයේ සිට අලාභ ලබමින් පැවතුනි. 2009 වර්ෂයේ රු.1,013,763ක අලාභයක් ලබා තිබුණි

(ඇ) පොහොර අංශය

සමාලෝචිත වර්ෂය සඳහා පොහොර අංශයේ කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර අදාල මූල්‍ය ප්‍රකාශන වලට අනුව පොහොර අංශයේ මෙහෙයුම් වලින් රු.5,420,314 ක අලාභයක් ද ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.37,357,276 ක ලාභයක් ද වූයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.42,775,590 ක (114%) ලාභයේ පිරිහීමක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී පොහොර විකුණුම් ආදායම රු.47,378,282කින් අඩුවීම හා පොහොර විකුණුම් පිරිවැය රු.25,868,713 කින් (27% කින්) වැඩි වීම මෙමම අලාභයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 කර්මාන්තශාලා කාර්ය සාධනය

(අ) වසර 3ක එක් එක් කර්මාන්ත ශාලා වල තේ නිෂ්පාදනය පිළිබඳ ප්‍රකාශයක් පහත දැක්වේ.

| වර්ෂය | කර්මාන්තශාලාවේ නම | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වලහන්දුව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරළේ | එකතුව |
| | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) | (කි.ග්‍රෑ.) |
| 2007 | 430,060 | 218,398 | 443,352 | 359,728 | 136,132 | 260,679 | 328,202 | 299,764 | 761,754 | 214,070 | 430,267 | 162,080 | 435,393 | 4,479,879 |
| 2008 | 328,902 | 236,181 | 362,019 | 305,722 | 103,656 | 117,190 | 335,648 | 306,975 | 749,879 | 170,915 | 417,012 | 237,718 | 415,690 | 4,087,507 |
| 2009 | 215,419 | 30,799 | 320,422 | 178,521 | 253 | 86,080 | 266,069 | 170,888 | 381,466 | 135,765 | 364,673 | 89,759 | 373,228 | 2,613,341 |
| 2008 වර්ෂය සමග සැසඳීමේදී (අඩුවීම්) / වැඩිවීම් ප්‍රතිශතය | (34.5) | (86.95) | (11.49) | (41.6) | (99.75) | (26.54) | (20.72) | (44.33) | (49.12) | (20.56) | (12.55) | (62.24) | (10.21) | (36.06) |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමස්ථ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 1.474.166 කින් එනම් 36.1% කින් අඩු වී තිබුණි. තවද ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියලුම කම්හල්වල නිෂ්පාදනය පහත වැටී තිබුණු අතර බලන්ගොඩ හා ගිලීමලේ කම්හල්වල එකී ප්‍රතිශතය 86.95 හා 99.75 ක් විය.

(ආ) වසර 3ක එක් එක් කර්මාන්ත ශාලා වල තේ කිලෝග්‍රෑමයකට විකුණුම් මිල පිළිබඳ ප්‍රකාශයක් පහත දැක්වේ.

කර්මාන්තශාලාවේ නම

| වර්ෂය | වලහන්දුව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පන්සල තැන්න | රයිගම් කෝරළේ | සාමාන්‍ය මිල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2007 | 304 | 240 | 309 | 282 | 254 | 298 | 233 | 234 | 246 | 312 | 230 | 225 | 313 | 268 |
| 2008 | 309 | 242 | 318 | 285 | 266 | 295 | 212 | 230 | 253 | 305 | 221 | 208 | 325 | 266 |
| 2009 | 389 | 305 | 385 | 352 | 0 | 367 | 316 | 267 | 296 | 387 | 331 | 299 | 400 | 314 |
| 2008 වර්ෂය සමඟ සැසඳීමේදී අඩුවීම්/වැඩිවීම් ප්‍රතිශතය | 25.8 | 26.0 | 21.0 | 28.4 | 0 | 24.4 | 49.0 | 16.0 | 16.9 | 26.8 | 49.7 | 30.4 | 23.0 | 18.3 |

ගිලීමලේ කර්මාන්තශාලාවේ හැර අනෙකුත් සියලුම කම්හල් වල නිමි තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය විකුණුම් මිල පසුගිය වර්ෂය හා සැසඳීමේදී 18.3% කින් වැඩිවී තිබුනි.

(ඇ) වසර 3ක එක් එක් කර්මාන්ත ශාලා වල වර්ෂය සඳහා ලාභය/පාඩුව පිළිබඳ ප්‍රකාශයක් පහත දැක්වේ

| වර්ෂය | කර්මාන්තශාලාවේ නම<br>වලහන්දුව | බලන්ගොඩ | දෙණියාය | ඇල්පිටිය | ගිලීමලේ | හිනිදුම | කැප්පෙටිපොල | කොත්මලේ | මහවැලි | මාවරල | පස්සර | පත්සල තැන්න | රයිගම් කෝරලේ | එකතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000) | (රු'000 |
| 2007 | 14260 | (1673) | 771 | 3015 | (4259) | (933) | 5284 | 6076 | 22959 | 3971 | 12688 | (1336) | 21033 | 9979 |
| 2008 | 1243 | (6228) | 5162 | (16332) | (7644) | (8206) | (7461) | (6382) | 877 | (3192) | (3924) | (11802) | 9373 | (5452 |
| 2009 | 952 | (7832) | 7798 | (7792) | (1669) | (4700) | 10363 | (2779) | 5421 | (1035) | 17668 | (1557) | 16718 | 3155 |
| 2007 වර්ෂය හා සැසඳීමේදී අඩුවීම්/ වැඩිවීම් ප්‍රතිශතය | (23.41) | (25.75) | 51.06 | 52.28 | 78.16 | 42.72 | 238.89 | 56.45 | 518.12 | 67.57 | 550.25 | 86.8 | 78.36 | 157.8 |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කර්මාන්තශාලා අංශයේ ලාභය රු.86,083,000 කින් එනම් 157.87% කින් වැඩිවී තිබුණු අතර වලහන්දුව හා බලන්ගොඩ කර්මාන්තශාලා හැර අනෙකුත් සියලුම කර්මාන්තශාලාවල ලාභය 42% ක සිට 550% දක්වා වූ පරාසයක් තුළ වැඩිවී තිබුණි.

(ඈ) වසර 3ක එක් එක් කර්මාන්ත ශාලා වල අමු තේ දළු මිලදී ගැනීම පිළිබඳ ප්‍රකාශයක් පහත දැක්වේ.

| වර්ෂය | කර්මාන්තශාලාවේ නම<br>වලහන්දුව (කි.ග්‍රෑ) | බලන්ගොඩ (කි.ග්‍රෑ) | දෙණියාය (කි.ග්‍රෑ) | ඇල්පිටිය (කි.ග්‍රෑ) | ගිලීමලේ (කි.ග්‍රෑ) | හිනිදුම (කි.ග්‍රෑ) | කැප්පෙටිපොල (කි.ග්‍රෑ) | කොත්මලේ (කි.ග්‍රෑ) | මැ.ැලි (කි.ග්‍රෑ) | මාවරල (කි.ග්‍රෑ) | පස්සර (කි.ග්‍රෑ) | පන්සල තැන්න (කි.ග්‍රෑ) | රයිගම් කෝරළේ (කි.ග්‍රෑ) | එකතුව (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2007 | 2090902 | 1019880 | 2099483 | 1687326 | 679115 | 1282648 | 1503227 | 1387470 | 3395592 | 1035887 | 1940804 | 759657 | 2050534 | 20932525 |
| 2008 | 1580206 | 1079336 | 1718593 | 1472881 | 494538 | 566154 | 1539038 | 1396819 | 3398601 | 872694 | 191983 | 1103400 | 1944701 | 19078944 |
| 2009 | 1035305 | 151794 | 1577753 | 865239 | 1267 | 422873 | 1193267 | 801561 | 1770202 | 656593 | 1615684 | 395222 | 1746707 | 12233467 |
| 2008 වර්ෂය හා සැසදීමේදී අඩුවීම්/ වැඩිවීම් ප්‍රතිශතය | (34.48) | (85.93) | (8.19) | (41.25) | (99.74) | (25.3) | (22.46) | (42.61) | (47.91) | (24.76) | (15.49) | (64.18) | (10.18) | (35.87) |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසදීමේදී සමස්ත අමු තේ දළු මිලදී ගැනීම 35.87% කින් අඩු වී තිබුණි.

(ii) පන්සලතැන්න, බලංගොඩ සහ ගිලීමලේ කර්මාන්තශාලා අමු තේ දළු මිලදී ගැනීම සම්බන්ධයෙන් 64.18% සිට 99.74% දක්වා වූ පරාසයක් තුල සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

(iii) 2005 වර්ෂයෙන් පසු සමස්ත අමුදළු මිලදී ගැනීම සමාලෝචිත වර්ෂයේ දී අවම මට්ටමක පැවතුණි

3.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

2003 වර්ෂයේ සිට අරමුදලේ කර්මාන්තශාලා 5 ක ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාළව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල රු.21,743,140 දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ඉදිකිරීම් වැඩ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

අරමුදලේ සභාපතිවරයා විසින් ඉදිරිපත්කර ඇති අදහස්වලට අනුව, දැරණියගල කර්මාන්තශාලාවේ කොන්ත්‍රාත්කරු සමග මතුවී ඇති අර්බුදය නිරාකරණය කිරීම සඳහා බේරුම්කරුවකු වෙත යොමුකර ඇති බවත් යටිතුවර කර්මාන්තශාලාවේ වැඩ 2011 වර්පයේදී ඇරඹීමට නියමිත බවත් දක්වා ඇත.

3.2.3 අරමුදල් ඌණ උපයෝජනය

බැංකු ශේෂ සනාථ ලිපියට අනුව 2009 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,020,045 ක් වූ බැංකු ගිණුම් 05 ක් දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රීයව පැවතුනු අතර එම ශේෂ ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

3.2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

වටිනාකම රු.971,532 ක් වූ පොලිතින් තොග 2007 වර්ෂයේ සිට මේ දක්වා දේශීය තේ විකුණුම් අංශයේ ගබඩාවල නිෂ්ක්‍රීයව පැවතුණි.

3.3 හඳුනා ගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 24 සිට 2008 ජූලි 10 දක්වා කාල පරිච්ඡේදය තුල කොත්මලේ තේ කර්මාන්තශාලාවේ රු.1,221,950 ක මුදල් වංචාවක් සිදු වී තිබුණි. මෙම මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.
මෙම කරුණට අදාල ප්‍රධාන චූදිතයා මියගොස් ඇතිබව අරමුදලේ සභාපතිවරයා දන්වා ඇත.

(ආ) ප්‍රධාන කාර්යාලය විසින් නියමිත කාල පරිච්ඡේදය තුලදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.80,433 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඇ) තේ ශක්ති අරමුදලේ පොහොර අංශයේ අවසන් ගිණුම්වලට අනුව රු.1,097,728 ක අවාසිදායක පොහොර තොග විචලනයක් දැක්විණි.

(ඉ) යටිනුවර සහ දැරණියගල තේ කර්මාන්තශාලා ඉදිකිරීම වෙනුවෙන් 2007 නොවැම්බර් 30 දින ලබා ගෙන තිබූ රු.මිලියන 50 ක ණය මුදල් අදාල ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා නොගෙන භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ආයෝජන පොලිය ලෙස රු.7,478,407ක් උපයා ගෙන තිබුණු නමුත් එම කාල පරිච්ජේදය සඳහා ගත් ණය සඳහා පොලී වෙනුවෙන් රු.10,345.039 ක් පොලී ලෙස ගෙවීමෙන් රු.2,866,632ක අලාභයක් ලබා තිබුණි.

3.4 වාහන උපයෝජනය

අරමුදල සතු වාහන 16 ක ඇණිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 6 කට වැඩි කාලයක් නිෂ්ක්‍රියව ගාල්කර තිබුණු ඩබල් කැබ් රථ දෙකක් අලුත්වැඩියා කිරීමට හෝ විකිණීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.
සභාපතිවරයාගේ පිළිතුරු ලිපියට අනුව මෙම කැබ් රථ දෙක පොල් සංවර්ධන අධිකාරිය සතුව තිබී තේ ශක්ති අරමුදලට ලබා දී තිබූ බවත් තේ ශක්ති අරමුදලට හිමිකම් ලබාගත් වහාම ඒවා විකිණීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.

(ආ) ප්‍රවාහන අංශයෙන් ලබාගත්තාලද තොරතුරු අනුව තේ ශක්ති අරමුදලට අයත් නොවූ වාහනයක් සඳහා අරමුදල විසින් ඉන්ධන සහ රියදුරු අතිකාල හා සංයුක්ත දීමනා 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා පිළිවෙලින් රු.459,266 ක් හා රු. 121,487 ක් වැය කර තිබුණි. නමුත් ඊට අදාල ධාවන සටහන් පරීක්ෂාවේදී එම වාහනය තේ ශක්ති අරමුදලේ රාජකාරි සඳහා යොදවා ගත් බවක් අනාවරණය නොවීණි.

3.5 ක්‍රියාකාරී සැලැස්ම

2008-2012 සංයුක්ත සැලැස්මට අනුව 2009 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.6 අයවැය ලේඛනමය පාලනය

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:2:1 වගන්තිය ප්‍රකාර අරමුදලේ සමස්ත අයවැයගත ශේෂ පත්‍රයක් හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) නිමකර භාරදීම (Turnkey Project) යටතේ යටියන්තොට හා දැරණියගල තේ කම්හල වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 117 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා කම්හල වෙනුවෙන් වාර්ෂික අයවැයෙන් රු.45,033,050ක ප්‍රාග්ධන ප්‍රතිපාදන සළසා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී සත්‍ය වශයෙන් වැයකර තිබුනේ ඉත් රු.290,413 ක් එනම් 0.5% ක් පමණි.

4. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මුදල් පාලනය

(ඇ) අන්තර් අංශ ජංගම ගිණුම්

(ඈ) කර්මාන්තශාලා මෙහෙයුම්

(ඉ) වාහන උපයෝජනය

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

එච්.ඒ.එස්. සමරවීර
වැඩ බලන විගණකාධිපති